වාර්ෂික වාර්තාව
2010

PIM

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයය

හැඳින්වීම

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය (පී.අයි.එම්) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයයට අනුබද්ධ ව පිහිටවනු ලැබූ අර්ධ - ස්වාධීන ආයතනයකි. මෙහි අරමුණ වනුයේ විවිධ කළමනාකරණ හා පරිපාලන විෂය ක්ෂේත්‍රවල පශ්චාත් උපාධි උපදේශන, පුහුණු හා පර්යේෂණ ඔස්සේ ශ්‍රී ලංකාවෙහි කළමනාකරණය පිළිබඳ උසස් අධ්‍යාපනය හා වෘත්තිකත්වය ප්‍රවර්ධනය කිරීම යි. ජ්‍යෙෂ්ඨ මට්ටමේ දහස් සංඛ්‍යාත කළමනාකරුවනට හා පරිපාලකයනට, අධ්‍යාපන හා නිපුනතා වර්ධනය සඳහා, අභියෝගාත්මක අවස්ථා සපයමින්, මෙ ම ආයතනය වඩා පුළුල් පදනමක් මත, වෘත්තීය කළමනාකරණ අධ්‍යාපන හා පුහුණුව පිළිබඳ වර්තමාන ජාතික අවශ්‍යතා සපුරාලයි. ශ්‍රී ලංකාවෙහි උසස් කළමනාකරණ අධ්‍යාපනය පිළිබඳ පුරෝගාමියා ලෙසින්, කළමනාකරණ ඥානය, නව්‍යකරණයෙහි හා ව්‍යාප්තියෙහි නියැලුණවුන් හට, මෙන් ම උසස් දැනුම් විකල්ප ගවේෂණය කරන්නන්හට, නායකත්වය සපයයි.

1978 විශ්වවිද්‍යාල පනත යටතේ අතුරු විධානයෙකින් පිහිටුවනු ලැබූ PIM ආයතනය, ශ්‍රී ලංකාවෙහි විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පවත්නා පශ්චාත් උපාධි ආයතන හතට ඇතුළත් වන්නකි. සාපේක්ෂ වශයෙන් එ තරම් කල් පසු කළ ආයතනයක් නොවුව ද, PIM උක්ත ආයතන අතුරින් වැඩි ම ශිෂ්‍ය-සංඛ්‍යාවක් ඇති ආයතනය වන අතර, මෙ රට විශ්වවිද්‍යාල පද්ධතියෙහි එක ම ස්ව-මූල්‍ය උත්පාදන උසස් අධ්‍යාපන ආයතනය වන්නේ ය.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙහි කළමනාකරණ අධ්‍යයන පීඨයෙහි, 1981 දී පශ්චාත් උපාධි ආයතන ඒකකය පිහිටුවීම දක්වා මෙ ම ආයතනයෙහි ආරම්භය ඇදී යයි. CIDA පදනම යටතේ කැනේඩියානු විශ්වවිද්‍යාල දෙකක් වන ඔටාව විශ්වවිද්‍යාලයේත්, කාල්ටන් විශ්වවිද්‍යාලයේත් සහයෝගිත්වයෙන් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු මෙ ම ඒකකයෙන් ආරම්භ කරන ලදී. මෙ ම ඒකකය, 1986 දී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය තුළ, ස්වාධීන ආයතනයක් ලෙසින් උසස් කරන ලදී. 1995 දී මෙ ම ආයතනය කොළඹ 08, හි වූ ලෙස්ලි රණගල මාවතේ පිහිටි අළුතින් ඉදි කරන ලද ගොඩනැගිල්ලට ගෙන යන ලදී.

අභිප්‍රාය

ඉදිරි පස්-අවුරුදු කාලය තුළ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙහි කාර්ය මෙහෙයැවනුයේ දකුණු ආසියානු හා මැද පෙරදිග ප්‍රදේශයන්හි කළමනාකරණය පිළිබඳ විශිෂ්ටතම කේන්ද්‍රය බවට පත්වීමේ අපේක්ෂාවෙනි. ශ්‍රී ලංකාවෙහි මේ දක්වා කළමනාකරණය පිළිබඳ උසස් අධ්‍යාපනය ලබා දීමේ හා වර්ධනය කිරීමේ විශිෂ්ටත්ව කේන්ද්‍රය බවට පත්වීම සඳහා මේ දක්වා වූ ආයතනික ප්‍රගතිය අනුව, උක්ත අභිප්‍රාය සහේතුක වෙයි. ආයතනයේ ඊළඟ වර්ධනීය අවස්ථාව වනුයේ ප්‍රදේශය තුළ කළමනාකරණකාරිත්වය පිළිබඳ විශිෂ්ටතම ආයතනය බවට පත්වීමෙහි ලා කැප වීමයි.

මෙහෙවර

මෙහෙවර පස්-විධ පිළිවෙත වන දැක්ම, ප්‍රයත්නය, සුසංයෝගය, සංයමය හා සැලැකිල්ල ඔස්සේ කළමනාකරණ අධ්‍යාපනය හැඩගැස්වීමයි. අපගේ සමස්ථ කර්තව්‍යය වනුයේ මෙ ම පස්-විධ ප්‍රවේශය ඔස්සේ සිය පුරුෂ හා කාන්තා ශක්ති මෙහෙයවන නායකයන් නගාලීම හා සමස්ත සමාජයෙහි යහපත උදෙසා, ඔවුන්ගේ ව්‍යවසායවල වටිනාකම වර්ධනය කළ හැකි කළමනාකරුවන් පිරිසක් බිහි කිරීමය.

වර්තමානයෙහි භිෂ්ග මිනිස් ප්‍රවර්ධනයට මෙ ම අංග අවශ්‍ය වන බව PIM හි අපි දැඩි ව විශ්වාස කරමු.

* ප්‍රායෝගික ඥානයෙන් දැඩි ව පෝෂණය වුණු ඥානය පාදක කරගත් අධ්‍යයනය
* කාර්ය සාධනයට ඉවහල් වන නිපුණතා අඛණ්ඩ ව වර්ධනය කිරීම
* හික්මැවුණු වෘත්තිකත්වය උදෙසා අවල කැපවීම
* වටිනාකම නිර්ණය කිරීමේ පරමාර්ථය උදෙසා නවීකරණය කෙරෙහි දක්වන සැලැකිල්ල

  අපගේ වැඩ සටහන් සංකල්ප පද්ධතියේ චතුර් ස්ථම්භ මේවා වෙයි. අපගේ ආයතනයට ඇතුළු වන සියල්ලන් ගෙන්ම අප උදක්ම අපේක්ෂා කරනුයේ මෙ ම සංකල්ප පද්ධති මත පිහිටා කටයුතු කරන ලෙසයි.

ඉහතින් සඳහන් ලද ප්‍රතිලාභවලට පදනම් වනුයේ පහතින් දැක්වෙන පස්-විධ සාමූහික වටිනාකම් පද්ධතිය යි.

* අපගේ සෑම කටයුත්තක දී ම අවිශිෂ්ට බව වළකාලීම.
* වටිනා බුද්ධි වර්ධනයෙහි ලා ක්‍රියාකාරී වීම
* දැනුම අත්පත් කර ගැනීමෙහි මෙන්ම ඒ බෙදා හැරීමෙහි දී ද, නිර්මාණශීලී වීම
* අප ගේ සෑම කටයුත්තක දී ම, අඛණ්ඩ වැඩි දියුණුව
* අපගේ සියලු තීරණ හා ක්‍රියා සම්බන්ධයෙන් දක්වන අවංකභාවය හා විනිවිදභාවය

<u>අපේක්ෂා</u>

ඊළඟ පස්-වසර සඳහා PIM හි සිව්-විධ සාමූහික අපේක්ෂා වනාහි :-

* ආයතනය සිය කටයුතු මෙහෙයවීමට තෝරා ගන්නා වෙළෙඳ පොළෙහි අඛණ්ඩ ව ප්‍රමුඛයා වීම හා තරගකාරීත්වය අභිබැවීම, මෙන් ම, අඛණ්ඩ ව ජාතියේ ව්‍යාපාරික පාසල බවට පත් වීම.
* ප්‍රධාන අධ්‍යයන වැඩ සටහන් ප්‍රවාහයෙන් ඔබ්බට විහිදී ගොස්, කළමනාකරණ අධ්‍යයනයේ නැගී එන ක්ෂේත්‍ර වෙත ව්‍යාප්ත වෙමින් ආයතනයේ අදාළත්වය තීව්‍ර කිරීම.
* සංවිධානවලට විශිෂ්ට වූ, කෙටි කාලීන විධායක ප්‍රවර්ධන වැඩ සටහන් මෙහෙයැවීමෙන්, තෝරා ගැනුණු ක්ෂේත්‍ර ඔස්සේ කළමනාකරණ නිපුණතා වැඩි දියුණු කිරීම.
* අඛණ්ඩ ව අධ්‍යයන පාඨමාලාවල අදළත්වය ඉහළ නැංවීම

<u>අධ්‍යක්ෂකවරයා ගේ සමාලෝචනය</u>

ආරම්භක අධ්‍යක්ෂකවරයා ගේ ප්‍රධානත්වයෙන්, පශ්චාත් උපාධි අධ්‍යයන ඒකකයේ හඳුන්වා දුන් විශේෂ වැඩ සටහන් ඔස්සේ, දැනට තිස් වසරක ට පෙර, PIM ආයතනය ශ්‍රී ලංකාවට පිරිමස්නා කළමනාකරුවන් ප්‍රවර්ධනය කිරීමේ ජාතික මෙහෙවරට ප්‍රවිෂ්ට වූ අවස්ථාවේ දී ඉහළ මට්ටමේක කළමනාකරණ අධ්‍යයනය සඳහා මෙරටෙහි එතරම් සැලකිල්ලක් නොවීය. එ හෙයින්, ශ්‍රී ලංකාවෙහි MBA උපාධි වැඩ සටහන් පිහිටුවාලීම සඳහා ආරම්භක අධ්‍යක්ෂකවරයා, කැනේඩියානු ජාත්‍යන්තර සංවර්ධන ඒජන්සියේ (CIDA) සහයෝගය ලබා ගැනීමේ අටියෙන් එම ඒජන්සිය සමඟ සාකච්ඡා

පැවැත්වී ය. 1980 දශකයේ මුල් අවදියේ දී, මෙ රටෙහි ඒකාධිකාරී වෙළෙඳ පොළක් බිහි විය. ඉන් තිස් වසරකට පසු එ නම්, දැන් එ ම වෙළෙඳ පොළ බෙහෙවින් වෙනස් වී ඇති අතර තරගකාරී ස්වභාවයක් ද උසුලයි.

අද වන විට, රටෙහි විශ්ව විද්‍යාල අටෙක MBA උපාධිය හා එ හා සමාන පශ්චාත් උපාධි පිරිනමයි. දොළහකට අධික පෞද්ගලික-විදේශීය MBA වැඩ සටහන් PIM හා සමඟ තරග කරයි. මෙම වැඩ සටහන්, විදේශ අරමුදල් යොදා ගනිමින් ප්‍රබල ව ප්‍රචාරණය කරන අතර MBA වැඩ සටහන් සඳහා PIM අය කරන ප්‍රමාණය මෙන් දෙගුණයකට ද වඩා ගාස්තු අය කරයි. මෙ ම තරගකාරීත්වය ඇති වනුයේ ප්‍රවේශ සුදුසුකම් පහත හෙළීමෙන් ද බාහිර දේශකයන් සඳහා දේශීය විශ්ව විද්‍යාලයීය ආචාර්යවරුන් යොදවා ගැනීමෙන් ද, අපට ම අයත් දේට වඩා විදේශීය දේ විශිෂ්ට ලෙස සලකන දීන චින්තනයක් ඇති අයට පෙනෙන පරිදි උසස් යයි සැලැකෙන නම් යොද ගැනීමෙන් ද වේ.

ස්වීය අරමුදලෙන් කටයුතු මෙහෙයවන PIM ආයතනයට, උක්ත කරුණු මහත් ම අභියෝගය එල්ල කරයි. PIM ආයතනය මුහුණ දෙන වේතන සීමාවලට හා සෙසු වියදම්වලට පෞද්ගලික ආයතන මුහුණ නොපායි. මීට අතර ව වේතන, විදුලිය බිල්පත්, රක්ෂණ හා අය බදු, බාහිර කථාකාර්යවරුන්, ගොඩනැගිලි නඩත්තුව, ආරක්ෂක වියදම් හා උපකරණ, සම්පාදන, ප්‍රවාහන හා විගණන සඳහා වියදම් පියවා ගැනීම සඳහා අවශ්‍ය අරමුදල් ද උපයා ගැනීමට PIM ආයතනයට සිදු වී තිබේ. මෙය ශ්‍රී ලංකා රජයේ ඇති විශේෂිත අවස්ථාවක් සේ සලකනු වටී. එ නම්, රජයේ කාර්ය මණ්ඩලය ඔවුනට හිමි විය යුතු වැටුප් උපයා ගනිමින්, 26 ක් වූ සේවක සංඛ්‍යාවකින් ආයතනය මෙහෙයැවීමට සිදු වී තිබීම යි.
වසර තුළ දී PIM ආයතනය මෙහෙයවන ලද්දේ 2009-11, ඒකාබද්ධ සැලසුම මත කළමනාකරණ අධ්‍යක්ෂක මණ්ඩලය විසිනි. මූලික බලපෑම් ඇති කරවන ක්ෂේත්‍ර වන පර්යේෂණ උපාධි අධ්‍යාපනය පුහුණු කටයුතු හා ආයතනයේ ස්ව-මූල්‍ය උත්පාදන මත පවත්වා ගැනීමට ඉවහල් වන උපදේශන සේවා හා නව ආධ්‍යාපනික මෙහෙයුම් පිළිබඳ පොදු ප්‍රතිඵල දිරිගන්වනසුලු විය.

අත්පත් කරගත් ප්‍රතිඵල

අපගේ අභිප්‍රාය වනුයේ, විවිධ ක්ෂේත්‍රවලට සම්බන්ධිත කළමනාකරණ හා පරිපාලන අධ්‍යාපනය හා බැඳුණු පශ්චාත් උපාධි උපදේශන, පුහුණුව හා පර්යේෂණ ඔස්සේ ශ්‍රී ලංකාවෙහි කළමනාකරණ වෘත්තීයකත්වය හා උසස් අධ්‍යාපනය වර්ධනය කිරීමයි. දහස් සංඛ්‍යාත ජ්‍යෙෂ්ඨ කළමනාකරුවනට හා පරිපාලකයනට ඉගැනුම් හා කුසලතා වර්ධනය සඳහා අභියෝගාත්මක අවස්ථා සපයමින්, අද දින PIM ආයතනය වඩා පුළුල් ලෙස වෘත්තීය කළමනාකරණ අධ්‍යාපනයත් පුහුණුවත් පිළිබඳ ව වූ ජාතික මෙහෙවරට උර දී සිටී.
PIM ආයතනය ශ්‍රී ලංකාවේ ප්‍රාරම්භක උසස් කළමනාකරණ අධ්‍යාපන ආයතනය වෙමින් උසස් කළමනාකරණ ඥානය නිර්මාණය කිරීමත්, එ මෙන් ම ව්‍යාප්ත කිරීමත් අරමුණු කරගත් ව්‍යාපාරවල නියැළුණු හා උසස් අධ්‍යාපනය පිළිබැඳි විකල්ප ගවේෂණයෙහි යෙදුණු අය හට නායකත්වය සපයයි.

දකුණු ආසියාවේ උසස් කළමනාකරණ අධ්‍යාපනය පිළිබඳ ප්‍රමුඛයකු වෙමින් කළමනාකාරිත්වය පිළිබඳ ජාත්‍යන්තර තලයෙහි කළමනාකරණ ඥානයත්, ව්‍යවහාරයත් ප්‍රවේශ කරවීමේ වෑයමක අපි යෙදී සිටිමු.

අපගේ ප්‍රමුඛතම අරමුණ වනුයේ පස්-විධ පිළිවෙත වන දැක්ම, ප්‍රයත්නය, සුසංයෝගය, සංයමය හා සැලකිල්ල ඔස්සේ කළමනාකරණ අධ්‍යාපනය හා නව්‍යකරණය හැඩගැස්වීම යි. අපගේ සමස්ත කර්තව්‍යය වනුයේ මෙ ම පස්-විධ ප්‍රවේශය ඔස්සේ සිය පුරුෂ හා කාන්තා ශක්තිය මෙහෙයවන නායකයන් නගාලීම හා සමස්ත සමාජයෙහි යහපත උදෙසා ඔවුන්ගේ ව්‍යවසායවල වටිනාකම වර්ධනය කළ හැකි කළමනාකරුවන් පිරිසක් බිහි කිරීම ය.

පහසුකම් වැඩි දියුණු කරවීම

ශිෂ්‍යයන් සඳහා වඩාත් සතුටුදායක පහසුකම් සැපයීමේ අරමුණින් මෙ ම වසරෙහි දී පහත දැක්වෙන නව පහසුකම් හඳුන්වා දෙන ලදී.

ශාරීරික යෝග්‍යතා පුහුණු-මධ්‍යස්ථානය ඉතා වැදගත් වන කාර්ය-ජීවිතය හා ඉගෙනීම අතර තිබිය යුතු සමතුලිතතාව ඇති කර ගැනීමට MBA වැඩසටහන් හදාරන සැලකිය යුතු ශිෂ්‍ය කළමනාකරුවන් සංඛ්‍යාවකට හැකියාවක් නොපවතී. ජීවිතය හා බැඳුණු සිව්-මුහුණත වන ශාරීරික-මානසික-සමාජයීය හා ආධ්‍යාත්මික පැතිකඩ හසුරුවා ගැනීමේ කේන්ද්‍රීය වැදගත්කම PIM ආයතනයෙහි ශිෂ්‍ය කළමනාකරුවන් අගය කළ යුතු බව අපේක්ෂා කෙරේ. මෙ ම අපේක්ෂාව සාක්ෂාත් කර ගැනීමට උක්ත මධ්‍යස්ථානය උපකාරී වේ. මේ අරමුණින් ගොඩනැගිල්ලේ බිම්මහලෙහි වූ ගබඩාවෙහි ප්‍රයෝජනයට නොගත් කොටසක් ලබාගෙන ශාරීරික යෝග්‍යතා පුහුණු-මධ්‍යස්ථානය ලෙසින් සංවර්ධනය කරන ලදී. මීට අවශ්‍ය වන උපකරණ ලබා ගැනීමේ මූලික වියදම පියවා ගැනීමට ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ අනුග්‍රාහකත්වය ලැබිණි.

- වෙබ් පදනමින් ශිෂ්‍ය-ප්‍රගතිය වාර්තා කිරීමේ ක්‍රමවේදය: (Web-based Student Progress Reporting System) - මෙම ක්‍රමවේදය සකසන ලද්දේ MBA පාඨමාලාව හදාරන කාලපරිච්ඡේදය තුළ දී ශිෂ්‍යයනයට සිය අධ්‍යාපන ක්‍රියාකාරීත්වය යාවත්කාලීනව වෙබ් අඩවිය ඔස්සේ බලා ගැනීම සඳහා ය. එක් එක් විෂය වෙනුවෙන් උපයා ගත් ලකුණු, පාඨමාලාවල ලකුණුවල සාමාන්‍ය, අදාළ ශිෂ්‍ය කණ්ඩායමෙහි තම-තමන්ගේ තත්ත්වය, වැනි කරුණු මින් ශිෂ්‍යයනට බලා ගත හැකිය.

- විශේෂයෙන් ම වර්ෂා කාලවල දී පහසුවෙන් ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි පූට්ටු ගල් යොදා ගනිමින් රථ වාහන ගාල යළි සකසන ලදී.

- ආචාර්ය මණ්ඩලයේ පහසුකම් හා වෙසෙසින් ම ඔවුන්ගේ කාර්යාල පහසුකම් වැඩි දියුණු කරන ලදී .

- දේශන ශාලා දෙකකට ද, ශිෂ්‍යයන්ගේ අධ්‍යයන කටයුතු වල යෙදෙන කාමර ආදියට ද, අළුත් පුටු හා මේස සපයන ලදී.

- දේශන ශාලාවල ශබ්ද විකාශන පද්ධතිය වැඩි දියුණු කරන ලදී.

- ගොඩනැගිල්ල සුණු පිරියම් කරන ලද අතර නඩත්තු කටයුතු නොකඩවාම සිදු කරන ලදී.

- ස්වයංක්‍රීය බාර් සංකේත පද්ධතිය හඳුන්වා දෙන ලද අතර මේ නිසා ශිෂ්‍යයන්ගේ පැමිණීම අතින් ලේඛන ගත කිරීමේ අවශ්‍යතාව නතර කරන ලදී.

පරිගණක හා අන්තර්ජාල ඔස්සේ ශිෂ්‍යයන් විසින් ආචාර්ය මණ්ඩලය ඇගැයීමේ ක්‍රමය හඳුන්වා දෙන ලද අතර පාඨමාලා හා සම්බන්ධිත පත්‍රිකා හා ශිෂ්‍යයන් විසින් උපයා ගත් පරීක්ෂණ ලකුණු පරිගණක හා අන්තර්ජාලය තුළින් යාවත්කාලීන කිරීම මෙම අවුරුද්දේදී ද ඉදිරියට ගෙන යන ලදී.

කළමනාකරණ පුහුණුව හා උපදේශන සේවා

2010 වසරේ දී, මෙතෙක් ක්‍රියාත්මක නොකරන ලද ප්‍රමාණයේ විධායක ප්‍රවර්ධන වැඩ සටහන් සංඛ්‍යාවක් පවත්වන ලදි.

	ආයතනය	වැඩ සටහන	ඇරැයුම	නිමාව
01	SLASSCOM ශ්‍රී ලංකාවේ මෘදුකාංග සමාගම් සංගමය	කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි සහතික පාඨමාලාව	2009 ඔක්තෝබර් 14	2010 පෙබරවාරි 05
02	HEMAS Holdings PLS	පොදු කළමනාකරණ වැඩ සටහන	2009 නොවැම්බර් 07	2010 මාර්තු 06
03	Hatton National Bank	විධායක කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	2010 මාර්තු 06	2010 ජුලි 03
04	රජරට විශ්ව විද්‍යාලයය	අධ්‍යාපන කාර්යමණ්ඩලය සඳහා නායකත්ව වර්ධනය පිළිබඳ වෘත්තිය පුහුණුව	2010 පෙබරවාරි 24	2010 පෙබරවාරි 26
05	රජරට විශ්ව විද්‍යාලයය	-එම-	2010 මාර්තු 04	2010 මාර්තු 05
06	SUNTEL LTD	කළමනාකරණ ප්‍රවර්ධන පුහුණු වැඩ සටහන	2010 මාර්තු 06	2010 අප්‍රේල් 24
07	ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය	කළමනාකරණ ප්‍රවර්ධන වැඩ සටහන	2010 මාර්තු 15	2010 අප්‍රේල් 25
08	Sri Lankan Airlines	උපාධිධාරී පුහුණුවන්නන් බඳවා ගැනීම-ප්‍රවේශ පරීක්ෂණය පැවැත්වීම හා උත්තර පත්‍ර ඇගැයීම	2010 අගෝස්තු	2010 අගෝස්තු 09
09	ලංකා ඛනිජතෙල් සංස්ථාව -Ceypetco	ධනාත්මක ආකල්ප, සේවක කැපවීම හා නායකත්වය පිළිබඳ වැඩ මුළුව	2010 සැප්තැම්බර් 11	2010 සැප්තැම්බර් 25

පාඨමාලා සැලැසුම් හා (සැපැයුම) නිකුතුව

පාඨමාලා හදාරන ශිෂ්‍යයනට වටිනාකමක් ලබා දෙමින් තරගකාරිත්වයෙහි ඉහළින් රැඳී සිටීම සඳහා MBA වැඩසටහන්වල යෝග්‍යතාව වැඩි දියුණු කිරීමට නව්‍ය-ප්‍රයත්නවල නියැලිණි. මෙ ම වසරේ දී පහත දැක්වෙන වෙනස්කම් සිදු කෙරිණි.

- **පාඨමාලා ආකෘති (Course Outline)**

  අන්තර්ගතයෙහි තීව්‍රතාව ද පැහැදිලි දිශාව ද සපයනු සඳහා පාඨමාලා ආකෘති යළි සකසන ලදි. පූර්ණ එ මෙන් ම මනාව සැලැසුම්කරන ලද පාඨමාලා ආකෘති හා සමග ම අනිවාර්යයෙන් කියවිය යුතු දෑ ලැයිස්තුගත කිරීමෙන් (I) පාඨමාලා සූදානම් කිරීමෙන් හා දැනුම නිකුතුවෙන් දේශකයනට ද (II) යම් සැසියක් සඳහා ශිෂ්‍ය - කළමනාකරුවණට කල්වේලා ඇතිව සූදානම් වීමට ද උපකාරී වී ඇත.

- **නිකුතු-මාධ්‍ය (Delivery mode)**

  මෙහිලා පැහැදිලි වෙනස්කම් දෙකක් සිදුකරන ලදි. පැය තුනක සැසියක් තුළ දී එක් කොටසක දී පමණක් නියම ලෙසින් ම දේශනය සඳහා යොදවා ගත යුතු ව පවතී. එ නම් පැවසුම (Tell) ය. සැසියේ ඉතිරි කාලය දැක්වීමටත් (උදා : වීඩියෝ) ඇසීමට හෙවත් සංවාදයට (Ask) එනම් සාකච්ඡාව හා සංවාදයටත්, කිරීමට (Do) හෙවත් අභ්‍යාස හා විශයානුබද්ධ අධ්‍යයන සඳහාත් යෙදවිය යුතුව පවතී. ශිෂ්‍ය කළමනාකරුවණට ධනාත්මක බලපෑමක් ඇති කරවමින් අපේක්ෂිත ඉගෙන්වීම් ප්‍රතිඵල ලබා ගැනීමට නිකුතුව (Delivery) සඳහා මෙම මාධ්‍ය හතර ම උපයෝගී කොට ගැනීමේ අවශ්‍යතාව ආචාර්ය මණ්ඩලය අවබෝධ කොට ගෙන සිටිති.

- **ආගන්තුක දේශන (Guest Lectures)**

  විශේෂිත මාතෘකා මත ආගන්තුක දේශන පැවැත්වීමට කර්මාන්ත ක්ෂේත්‍රයෙහි නියුක්ත වූ ප්‍රමුඛ පුද්ගලයන් බෙහෙවින් අන්යුක්ත කර ගනිමින් පවතී. මෙ ම සැසි පූර්ව-සැලැසුම් කරන ලද ඒවා වන අතර පාඨමාලා ආකෘතිවලට ද ඇතුළත් කොට ඇත. මෙ ම ආගන්තුක දෙශකයන්ගේ ඉදිරිපත් වීම වැඩදායක වී ඇති අතර ඇත්ත වශයෙන් ම මෙ ම ක්‍රියා මාර්ගය අපගේ MBA වැඩසටහන් හා අපගේ තරගකරුවන්ගේ වැඩසටහන් අතර වැදගත් වෙනස්කමක් නිර්මාණය කරයි.

- **ලකුණු නිකුත් කිරීම (Release of Marks)**

  නියමිත වේලාවෙහි දී ලකුණු නිකුත් කිරීම සඳහා ආචාර්ය මණ්ඩලයට නිශ්චිත කල් වේලා ලබා දී ඇත. එනම් අවසාන පරීක්ෂණය පවත්වන දිනයේ සිට දින 21ක් ඇතුළත දී ය. මේ පිළිබඳ ව සමීප අවධානයක් රඳවා ඇති අතර මෙ ම කරුණ ආචාර්ය මණ්ඩලයේ වැදගත් ඵලදායිතා දර්ශකයක් වෙයි.

- **ශිෂ්‍ය- ඇගැයීම් (Student Evaluation)**

  පාඨමාලාවක් පිළිබඳව ශිෂ්‍යයන්ගේ ආකල්පය නිරීක්ෂණය කිරීමට ශිෂ්‍ය-ඇගැයීම වැදගත් වෙයි. වාර අවසානයේ දී එක් එක් ශිෂ්‍යයා විසින් සිදු කෙරෙන ඇගැයීම සම්පිණ්ඩනය කෙරෙන අතර ශිෂ්‍ය කළමනාකරුවන්ගේ දෘෂ්ටිය අනුව ආචාර්ය මණ්ඩල - සාමාජිකයන්ගේ කාර්ය ඵල දක්වනු ලැබේ. ආචාර්ය මණ්ඩලයේ තවත් එක්

වැදගත් ඵලදායිතා දර්ශකයක් ලෙසින් 1 සිට 5 දක්වා වූ මිනුම් දණ්ඩක පොදු ඇගැයීම් 4 දර්ශකයක් සෑම ආචාර්ය මණ්ඩල සාමාජිකයකු ගෙන් ම අපේක්ෂා කෙරේ.

උක්ත ඵලදායිතා දර්ශක ඒකාබද්ධ කිරීමෙන් ආචාර්ය මණ්ඩලය සඳහා 4x4x3 ක සූත්‍රය සැකසේ.

4= නිකුතු-මාධ්‍ය හතරේ මුසුව

4= දර්ශක 5 අතුරින් 4 මට්ටමේ ශිෂ්‍ය-ඇගැයීම

3= පරීක්ෂණ දිනයේ සිට සති 3ක් තුළ දී අවසන් ලකුණු නිකුත් කිරීම

වැඩසටහන් සම්පාදනයේ වැදගත් ලක්ෂණයක් නම් නේවාසික වැඩමුළුව යි. සාමාන්‍යයෙන් මෙ ම වැඩමුළු නාගරික පරිසරයෙන් ඈත් ව හෝටල්වල පැවැත්වෙන අතර, මෙ ම වසරේ දී එ වැනි වැඩමුළු දෙකක් පැවැත් වුණි. කණ්ඩායම් පරිසරයක නිර්මාණය වර්ධනය කෙරෙන, ලිහිල් පරිසරයක තෝරා ගත් ගැටළු පරීක්ෂා කිරීමට ශිෂ්‍යයනට ද ආචාර්ය මණ්ඩලයට ද මෙම වැඩමුළු උපකාරී වේ.

සංවර්ධනය සඳහා 5M - රාමුව

ඉදිරි වසරවල දී PIM ආයතනය ඉදිරියට රැගෙන යනු සඳහා පංච-මාන (Five Dimensional) වැඩ සටහනක් යොදා ගන්නා ලදි. මෙ ම 5M වැඩ සටහනින් විස්තර කෙරෙනුයේ Market (වෙළෙඳ පොළ) Member (ආචාර්ය මණ්ඩලය හා කාර්ය මණ්ඩලය) Mentors (පසු විපරම් හා උපදේශකත්වය සඳහා පත්කරන ලද ආචාර්යවරුන්) Monitors (එක් එක් ශිෂ්‍ය කණ්ඩායමක් සඳහා පත්කරන ලද පන්ති නායකයන් හා MBA උපාධිධරයන්ගේ සංගමයයි. (Alumni)

පශ්චාත් උපාධි සම්පූර්ණ කිරීම්

මෙ ම වසරෙහි දී විද්‍යාපති උපාධිය / පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සම්පූර්ණ කරන ලද ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ගේ සංඛ්‍යාව මෙසේ ය.

ව්‍යාපාර පරිපාලනය පිළිබඳ දර්ශන ශූරී උපාධිය	-	01
ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධිය	-	327
මූල්‍ය හා බැංකුකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය	-	02
මානව සම්පත් කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය	-	42
රෝගු පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධිය	-	60
රාජ්‍ය පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධිය	-	01
රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	-	01

ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	-	03
මූල්‍ය හා බැංකුකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	-	01
මුළු උපාධිධරයන් සංඛ්‍යාව	-	**438**

2011 ජූලි මස 23 වැනි දා පැවැත්වුණු විශ්වවිද්‍යාලයීය උපාධි ප්‍රධානෝත්සවයෙහි දී මෙ ම උපාධි අපේක්ෂකයනට පශ්චාත් උපාධි පිරිනමනු ලැබූහ.

ප්‍රචාරණය හා ආයතනයේ ප්‍රතිරූපය

2009 වසරෙහි දී ආයතනයේ සියලු ක්‍රියාකාරිත්වයන් හා වැදගත් සිදුවීම් ප්‍රචාරණය කිරීමට විශේෂිත ප්‍රයත්නයක් දරන ලදි. පුවත් පත් හා රූපවාහිනිය සියලුම ක්‍රියාකාරකම් හා වැදගත් සිදුවීම් පුළුල් ලෙස ප්‍රචාරණය කරන ලද අතර ඉන් PIM ආයතනයේ දෘෂ්‍යභාවය වර්ධනය විය.

2009 මාර්තු මාසයේ දී PIM ටී. ෂර්ට් හා හිස් වැසුම් නිර්මාණය කොට ශිෂ්‍යයන් හා ආදි ශිෂ්‍යයන් අතරේ අලෙවි කරන ලදි.

පර්යේෂණ ප්‍රකාශන සහ පුස්තකාලය

ශ්‍රී ලංකාවෙහි කළමනාකරණ විෂයෙහි පර්යේෂණ දැනට පවතිනුයේ මූලික අවධියෙක ය. මෙ ම විෂය පිළිබඳ පර්යේෂණ සම්ප්‍රදායක් අප කෙරෙන් මේ දක්වාම වර්ධනය වී නොමැත. මෙහි ලා පවතින සැබෑ අභියෝගය නම් අපගේ ප්‍රධාන පර්යේෂණ ප්‍රයත්න සංවිධානය කොට වර්ධනය කිරීමට අවශ්‍ය වන දර්ශන-පදනමක් සොයා ගැනීම යි.

පර්යේෂණයේ (හා සොයාගැනීමේ ප්‍රකාශනයෙහි) ප්‍රධාන අරමුණ නම් විද්‍යාවක් මෙන් ම වෘත්තියක් වශයෙන් කළමනාකරණ විෂය පෝෂණය කිරීමට අවශ්‍ය වන දේශීය කළමනාකරණ අන්තර්ගතය සොයා ගැනීම යි. ගෞරවනීය මට්ටම් වෙත පර්යේෂණවල තත්වයන් ඔසවාලීම සඳහා ක්‍රම හා ප්‍රවේශ නගා සිටුවීමට අපි සුදුසු මාර්ගය සොයමු. ශ්‍රී ලාංකික සන්දර්භයත් දැනුම හසුරවාලීමත් අතර පවත්නා මහත් හිඩැස් වෙත PIM ආයතනයේ පර්යේෂණ අරමුණු යොමු වී පවතී. ප්‍රකාශනයත් සංවාදයත් සඳහා දිගින් දිගටම පදනමක් සැපයීමට ආයතනයේ ත්‍රෛමාසික ප්‍රකාශනය වන ශ්‍රී ලන්කන් ජර්නල් ඔෆ් මැනේජ්මන්ට් විශාල වශයෙන් අවකාශ ලබා දෙයි. 2009 වසරේදී මෙම ප්‍රකාශනයෙහි අධි-ප්‍රමාණයේ වෙළුම් දෙකක් ප්‍රකාශයට පත් කරන ලදි. මෙ ම ප්‍රකාශනයෙහි මූලික අරමුණ නම් කළමනාකරණය හා සම්බන්ධිත ගැටළු, ප්‍රයෝග විධි හා වර්ධනයන් පිළිබඳව ප්‍රකාශන මාධ්‍යයක් ලෙස ක්‍රියා කරමින් උක්ත ක්ෂේත්‍රවල පර්යේෂණ හා අධ්‍යයන ප්‍රතිඵල ව්‍යාප්ත කිරීම යි. කළමනාකරණ ක්ෂේත්‍රයට සම්බන්ධිත කෘති විද්‍යාර්ථීන් හා වෘත්තිකයන් විසින් පළ කරවීමට මෙම සංග්‍රහය විවෘත ව පවතී.

වර්තමාන කළමනාකරුවන්ගේ නැඟී එන අවශ්‍යතා සපුරාලීමට මෙම ප්‍රකාශන සංග්‍රහයට අමතර ව අර්ධ වාර්ෂික "වෘත්තීය කළමනාකරු" සඟරාව ද මෙ ම වසරේදී ප්‍රකාශයට පත් කරන ලදි. වෙළෙඳ පොළට මෙම සඟරාව හඳුන්වා දීමේ පරමාර්ථය වූයේ කියවා තේරුම් ගැනමට පහසු ශෛලියකින් වැදගත් කළමනාකරණ දැනුම ව්‍යාප්ත කරවීමයි. යම් විශේෂිත විෂය නැඹුරුවක් මෙහි නොමැති වන අතර සංකීර්ණ හා කැළැඹුණු පරිසරයක සිය කටයුතු මෙහෙයවන වත්මන් කළමනාකරුවන් හට

වැදගත් වන, එ මෙන් ම කාලෝචිත ගැටළු මෙ ම සඟරාවෙන් ආමන්ත්‍රණය කෙරේ. කියැවීමට පහසු එ මෙන් ම අන්තර්ගතයෙන් පොහොසත් ලිපි සංග්‍රහයක් දෙවැනි කලාපයට ඇතුළත් විය.
පාඨකයන් වැඩි පිරිසක් සඳහා පහසුකම් සැපයීමට පුස්තකාලය තවදුරටත් වැඩි දියුණු කරන ලද අතර, පාඨක පහසුව සඳහා පහතින් දැක්වෙන පහසුකම් සපයන ලදි.

- පර්යේෂණ එකතුව හා තොරතුරු ලබා ගැනීමට සහාය වීම
- අන්තර් පුස්තකාල හුවමාරුව
- විෂය අනුව කෘති නාමාවලිය සැකැසීම හා ප්‍රදර්ශනය කිරීම
- අන්තර්ජාල සම්බන්ධතා හා වීඩියෝ
- ස්වයංක්‍රිය ග්‍රන්ථ නාමාවලිය

2010 වසර අවසානයෙහි දී කළමනාකරණය හා ඊට සම්බන්ධිත ක්ෂේත්‍රවලට අදාළ පොත් 30,000 ට වැඩි සංඛ්‍යාවක් ද සඟරා හා වාරික සංග්‍රහ 60 ක් ද පාඨකයන් වෙනුවෙන් සපයන ලදි.
පුස්තකාල සේවාව කාර්යක්ෂම කිරීම සඳහා පුස්තකාලය නවීකරණ වැඩ සටහනෙහි කොටසක් වශයෙන් තීරු සංකේත සංස්කරණ ක්‍රමයක් (Bar coded Circulation System) හඳුන්වා දෙන ලදි.

ව්‍යාපාරික හා වෙළෙඳ පොළ සබඳතා සහ කළමනාකරණ වර්ධන පුහුණුව

ප්‍රතිපත්තියක් ලෙසින්, කළමනාකරණ උපදේශන සේවා කාර්ය ආයතනය විසින් භාරගනු ලැබේ. බොහෝ විට ප්‍රායෝගික කළමනාකරණ ගැටලුවලට මුහුණ දීමෙන් මෙ ම උපදේශන සේවා කාර්ය මඟින් ආචාර්ය මණ්ඩලයේ විෂය කරුණු හා නිපුණතා වැඩි දියුණු කර ගැනීමට උපකාරී වේ. සමාගම් සැලසුම්කරණය සංවිධානය ප්‍රතිව්‍යුහගත කිරීම, කාර්ය විශ්ලේෂණය, වේතන වැටුප් පිළිවෙත්, පුහුණුව හා වර්ධනය හා ආයතනික වර්ධනය වැනි ක්ෂේත්‍ර හා සම්බන්ධිත කළමනාකරණ උපදේශක සේවා කිහිපයක් ම 2010 වසරේ දී සාර්ථකව නිම කිරීමට හැකි විය.

ව්‍යාපාරික ප්‍රජාවගේ ක්‍රියාශීලී සහායකයකු වීම සඳහා යත්න දැරේමේ අරමුණින් මෙ ම ආයතනය නියුක්ත වන තවත් එක් කාර්යෙකි පාරිභෝගිකයන් කේන්ද්‍ර කොට ගත් සේවක පුහුණුව. මෙ ම පාරිභෝගිකයනට නිෂ්පාදනය, සේවා සැපැයීම, බැංකු මූල්‍ය හා රක්ෂණ කටයුතු හා විශේෂ සේවා වැනි රාජ්‍ය හා පෞද්ගලික අංශවලට අයත් අංග ඇතුළත් වේ. මෙ ම වසර තුළ දී මෙ වැනි පුළුල් පැතිකඩකට අයත් වැඩමුළු හා පුහුණු වැඩ සටහන් පවත්වන ලදි.

කළමනාකරණ මණ්ඩලය

ආයතනයේ අධ්‍යයන හා විධායක මණ්ඩලය වන කළමනාකරණ මණ්ඩලය, පහතින් දැක්වෙන සාමාජිකයන්ගෙන් නියෝජනය විය.

මහාචාර්ය උදිත ලියනගේ මහතා, අධ්‍යක්ෂ සහ කළමනාකරණ මණ්ඩලයේ සභාපති.
ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යංශය (නියෝජනය - පියසේන රණේපුර මහතා)
ලේකම්, රාජ්‍ය පරිපාලන අමාත්‍යංශය (නියෝජනය - ඩබ්. එම්.පී.පී. වික්‍රමසිංහ මහතා)
ලේකම්, මුදල් අමාත්‍යංශය (නියෝජනය - ආචාර්ය ආර්.එච්.එස්. සමරතුංග මහතා)

අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනය (ආචාර්ය ටී. ඒ. වීරසිංහ මහතා)
සභාපති, ශ්‍රී ලංකා වරලත් ගණකාධිවරුන් ගේ ආයතනය (සුජීව මුදලිගේ මහතා)
සභාපති, ශ්‍රී ලංකා ඉංජිනේරුවන් ගේ ආයතනය (ආචාර්ය ධර්මසිරි අල්විස් මහතා)
සභාපති, ශ්‍රී ලංකා වානිජ සංගමය (ආචාර්ය අනුර ඒකනායක මහතා)
පීඨාධිපති, කළමනාකරණ හා වානිජ අධ්‍යයන පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයය (මහාචාර්ය සම්පත් අමරතුංග මහතා)
අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (ඩබ්. එම්. බන්දුසේන මහතා)
මහාචාර්ය අබේරත්න බණ්ඩාර මහතා, මූල්‍ය අධ්‍යයන අංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයය
මහාචාර්ය එච්. එච්. ඩී. එන්. පී. ඕපාත මහතා, මානව සම්පත් අධ්‍යයන අංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයය
මහාචාර්ය ඩී. ඒ. තන්තිරිගොඩ මහතා, භෞතික විද්‍යා අධ්‍යයන අංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයය
මහාචාර්ය එම්. එල්. ඒ. කාදර් මහතා, පේරාදෙණිය විශ්වවිද්‍යාලයය
එම්. එන්. ජුනේඩ් මහතා, සම සභාපති, ජාතික වැටුප් කොමිෂන් සභාව
ගාමිණී ගුණසිංහ මහතා, අධ්‍යක්ෂ, පරිසර සම්පත් ආයෝජන පෞද්ගලික සමාගම
ආචාර්ය දේවප්‍රිය නුගවෙල මහතා, සභාපති, ලින්ක් නැචුරල් නිෂ්පාදන සමාගම
ආචාර්ය වික්‍රම වීරසූරිය මහතා, ශ්‍රී ලංකා රක්ෂණ කටයුතු පිළිබඳ "ඔම්බුඩ්ස්මන්" වරයා

අධ්‍යයන මණ්ඩලය

උක්ත වර්ෂය තුළ අධ්‍යයන මණ්ඩලය නියෝජනය කරන ලද්දේ පහතින් සඳහන් ලද සාමාජික මහතුන් විසිනි.

ව්‍යාපාර පරිපාලන අධ්‍යයන මණ්ඩලය

මහාචාර්ය උදිත ලියනගේ මහතා, අධ්‍යක්ෂ, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය
ආචාර්ය සම්පත් අමරතුංග මහතා, පීඨාධිපති, කළමනාකරණ හා වානිජ අධ්‍යයන පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයය
මහාචාර්ය ඩේවිඩ් එවන්ස් මහතා, ආගන්තුක මහාචාර්ය
අර්ඩ්ලි පෙරේරා මහතා, සභාපති, සීමාසහිත එම්. ඇන්ඩ්. ටී (පෞද්ගලික) සමාගම
ආචාර්ය ට්‍රැවිස් පෙරේරා මහතා, PIM හි ජ්‍යෙෂ්ඨ උපදේශක
ආචාර්ය වික්‍රම වීරසූරිය මහතා, ශ්‍රී ලංකා රක්ෂණ ආයතන "ඔම්බුඩ්ස්මන්" වරයා
ආචාර්ය පී. සී. බී විජේසිංහ මහතා, වරලත් ගණකාධිකාරී

රාජ්‍ය පරිපාලන අධ්‍යයන මණ්ඩලය

මහාචාර්ය උදිත ලියනගේ මහතා, අධ්‍යක්ෂ, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය
ආචාර්ය එච්. එම්. ඒ. හේරත් මහතා, රාජ්‍ය පරිපාලන අධ්‍යයන අංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයය
මහාචාර්ය එස්. ඩබ්. රණසිංහ මහතා, පීඨාධිපති, මානව හා සමාජ විද්‍යා පීඨය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයය
ආචාර්ය ලොයිඩ් ප්‍රනාන්දු මහතා, වැඩසටහන් අධ්‍යක්ෂ, රාජ්‍ය පරිපාලන ව්‍යාපෘති පාඨමාලාව

ලලිත් වීරතුංග මහතා, ගරු ජනාධිපතිතුමන්ගේ ලේකම්
ආචාර්ය ජයම්පති වික්‍රමරත්න, ජනාධිපති නීතිඥ
මහාචාර්ය එම්. ඩබ්. වික්‍රමාරච්චි මහතා, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයය

මෙම වසර තුළ PIM ආයතනය මෙහෙයවන ලද්දේ 2009-2011 ආයතනික සැලැසුම පදනම් කරගෙන කළමනාකරණ අධ්‍යයන මණ්ඩලය විසිනි. මුඛ්‍ය කේන්ද්‍රවන පර්යේෂණ, උපාධි-අධ්‍යාපනය, පුහුණු හා උපදේශන සේවා, නව අධ්‍යාපන ව්‍යාපෘති හා ආයතනයේ ස්ව-මූල්‍ය උත්පාදනය සඳහා වන ආදායම් උත්පාදනය දිරිගන්වන සුලු විය.

ශිෂ්‍ය බඳවා ගැනීම

පාඨමාලා	ශිෂ්‍ය සංඛ්‍යාව
ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධිය	196
රෝගු පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධිය	65
ජාත්‍යන්තර වෙළෙඳාම හා ක්‍රමවේද පිළිබඳ විද්‍යාපති උපාධිය	66
රාජ්‍ය පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධිය	51
මානව සම්පත් කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය	37
එකතුව	415

ඉහතින් සඳහන් ලද අධ්‍යයන පාඨමාලා මෙ ම වර්ෂය තුළ දී මෙහෙයවන ලද අතර, එ ම පාඨමාලාවල වැඩ සටහන්- පරිපාටි, වර්ධනය වන ප්‍රවනතා හා දැනුම් අනුයමින් වැඩි දියුණු කරන ලදි.

පාඨමාලා සැලසුම් හා (සැපයුම) නිකුතුව

පාඨමාලා හදාරන ශිෂ්‍යයනට වටිනාකමක් ලබා දෙමින් තරගකාරීත්වයෙහි ඉහළින් රැඳී සිටීම සඳහා MBA වැඩසටහන්වල යෝග්‍යතාව වැඩි දියුණු කිරීමට නව්‍ය-ප්‍රයත්නවල නියැලිණි. මෙ ම වසරේ දී පහතින් දැක්වෙන වෙනස්කම් සිදු කෙරිණි.

(අ) පාඨමාලා ආකෘති (Course Outline)

අන්තර්ගතයෙහි තීව්‍රතාව ද පැහැදිලි දිශාව ද සපයනු සඳහා පාඨමාලා ආකෘති යළි සකසන ලදි.

(ආ) නිකුතු-මාධ්‍ය (Delivery mode)

මෙහිලා පැහැදිලි වෙනස්කම් දෙකක් සිදුකරන ලදි. පැය තුනක සැසියක් තුළ දී එක් කොටසක දී පමණක් නියම ලෙසින් ම දේශනය සඳහා යොදවා ගත යුතුව පවතී. එනම් පැවසුම (Tell) ය. සැසියේ ඉතිරි කාලය දැක්වීමටත් (උදා : වීඩියෝ) ඇසීමට හෙවත් සංවාදයට (Ask) එනම් සාකච්ඡාව හා සංවාදයටත්, කිරීමට (Do) හෙවත් අභ්‍යාසවල හා විශයානුබද්ධ අධ්‍යයන සඳහාත් යෙදවිය යුතු ව පවතී. ශිෂ්‍ය කළමනාකරුවනට ධනාත්මක බලපෑමක් ඇති කරවමින් අපේක්ෂිත ඉගෙන්වීම් ප්‍රතිඵල ලබා ගැනීමට නිකුතුව (Delivery) සඳහා මෙම මාධ්‍ය හතර ම උපයෝගී කොට ගැනීමේ අවශ්‍යතාව ආචාර්ය මණ්ඩලය අවබෝධ කොට ගෙන සිටිති.

(ඇ) ආගන්තුක දේශන (Guest Lectures)

විශේෂිත මාතෘකා මත ආගන්තුක දේශන පැවැත්වීමට කර්මාන්ත ක්ෂේත්‍රයෙහි නියුක්ත වූ ප්‍රමුඛ පුද්ගලයන් බෙහෙවින් අන්යුක්ත කර ගනිමින් පවතී. මෙ ම සැසි පූර්ව-සැලැසුම් කරන ලද ඒවා වන අතර, පාඨමාලා ආකෘතිවලට ද ඇතුළත් කොට ඇත. මෙ ම ආගන්තුක දෙශකයන්ගේ ඉදිරිපත් වීම වැඩදායක වී ඇති අතර, ඇත්ත වශයෙන් ම මෙ ම ක්‍රියා මාර්ගය අපගේ MBA වැඩසටහන් හා අපගේ තරගකරුවන්ගේ වැඩසටහන් අතර වැදගත් වෙනස්කමක් නිර්මාණය කරයි.

(ඈ) ලකුණු නිකුත් කිරීම (Release of Marks)

නියමිත වේලාවෙහි දී ලකුණු නිකුත් කිරීම සඳහා ආචාර්ය මණ්ඩලයට නිශ්චිත කල් වේලා ලබා දී ඇත. එනම් අවසාන පරීක්ෂණය පවත්වන දිනයේ සිට දින 21ක් ඇතුළත දී ය. මේ පිළිබඳව සමීප අවධානයක් රඳවා ඇති අතර, මෙ ම කරුණ ආචාර්ය මණ්ඩලයේ වැදගත් ඵලදායිතා දර්ශකයක් වෙයි. මෙ ම ක්‍රම වේදය කෙරෙහි ඉතා සමීප ව අවධානය රඳවන ලදි. මෙ ම කරුණු ආචාර්ය මණ්ඩලයේ මුඛ්‍ය ක්‍රියාකාරී දර්ශකයෙකි.

(ඉ) ශිෂ්‍ය -ඇගැයීම (Student Evalution)

පාඨමලාවක් පිළිබදව ශිෂ්‍යන්ගේ ආකල්ප නිරීක්ෂණය කිරීමට ශිෂ්‍ය ඇගයීම වැදගත් වේ.වාර අවසනයේ දී එක් එක් ශිෂ්‍යයා විසින් සිදුකෙරෙන ඇගයීම සම්පිණ්ඩනය කෙරෙන අතර , ශිෂ්‍ය කළමනාකරුවන්ගේ දෘෂ්ටිය අනුව ආචාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ගේ කාර්ය ඵල දක්වනු ලැබේ.මෙය ආචාර්ය මණ්ඩලයේ තවත් එක් වැදගත් ඵලදායිතා දර්ශකයකි.

ආචාර්ය මණ්ඩලයේ සම්පත් දායකයෝ

මෙහි පහතින් දැක්වෙන ආචාර්ය මණ්ඩලය 2010 වසරේදී ආයතනයට සිය සේවාව ලබා දුන්හ.මෙම කණ්ඩායම ස්ථිර, කොන්ත්‍රාත්, බාහිර විදහර්ථී හා වෘත්තීය පදනම්වලට අයත් වෙති.

<u>පූර්ණ කාලීන ආචාර්ය මණ්ඩලය</u>

මහාචාර්ය උදිත ලියනගේ මහතා
Dip.M, FCIM, MBA (Sri J),Ph.D.(Sri, J) PIM හි අධ්‍යක්ෂ

ආචාර්ය ට්‍රැවිස් පෙරේරා මහතා
MIED (UK), MBA (Sri J.)Ph.D.(Sri J)Senior Consultant

ආචාර්ය ජී.කේ.එල්.ජයවර්ධන මහතා
B Tech (Mad), MBA (Sri J),Ph.D.(Canb),Senior Consultant

ආචාර්ය අජන්ත ධර්මසිරි මහතා
B Sc.Eng. (Moratuwa) ,MBA (Sri J.) Ph.D.(Sri J.) Consultant

එස්.අතුරලියගේ මහතා
B Sc.Phy.Sc.(Ruhuna),M Sc.Comp,Sc(Col),Consultant

මහාචාර්ය තිලක් ෆොන්සේකා මහතා
BA. (Cey). L.L.B (Col) MBA (Sri J.) MA (Col)Ph.D.(Sri J.)Att-at-Law

මහාචාර්ය එස්.ඩබ්.රණසිංහ මහතා
BAP(Vid), MPA(Sri.J), Ph.D.(Sri. J)

ආචාර්ය වික්‍රම වීරසූර්ය මහතා
LLB. (Pera.),Ph.D.(London), Attorney-at-Low

ආචාර්ය ලොයිඩ් ප්‍රනාන්දු මහතා
M.sc. (Moscow), Ph.D. (Sussex)

කාල්ටන් සමරජීව මහතා
BA (Cey), B.Ed(Queens), Dip.Ed. (Lond), Dip.TEFL

මහාචාර්ය ඩේවිඩ් එවන්ස් මහතා
BA (Hons),M.Sc,Dip.Edu.

මාරියෝ ෆොන්සේකා මහතා
MCIM (UK), FSCMA, MBA(Sri J)

ආචාර්ය පෙනිලොපි හුඩ් මිය
DMS(Ed), M.Sc.(Edu.Mgt.) Ph.D.(Anglia)

මෆාස් ඉෂාක් මහතා
B.Sc.(Eng.), M.Sc.(Econ) M.Sc.(Eng.), CISA

අජන්ත මදුරප්පෙරුම මහතා
AIB (SL), FCMA (UK), CFA, MBA (Sri.J.)

ආචාර්ය ට්‍රේසි කාටර් මිය
B.Sc. (Wright State), MBA,Ph.D. (Georgia)

චන්න ගුණවර්ධන මහතා
B.Sc.(Hon),ACA,ACMA,MBA,(Sri.J)

සංජීව ජයරත්නම් මහතා
C.Eng.MBCS,Bsc.(Manchester),MBA(Sri J.)

තිස්ස ජයතිලක මහතා
BA (Cey),MA(Wake),MPA(Sri J.)

හුසේන් මුසාජී මහතා
FCA,FCMA,MBA,(Sri.J)

ආචාර්ය සතිෂ් ශින්ඩේ මහතා
M.Sc.MBA.Ph.D.(Pune)

සේනක වීරසූරිය මහතා
B.sc.(ANU), MIT(Canberra)

සුනිල් විජේසිංහ මහතා
FCMA, C.Eng. MBA(Sri.J.)

රවී එදිරිසිංහ මහතා
MBA (PIM-USJ), ACMA(UK), FSCMA

පාඨමලා මෙහෙයවීමේ ද දර්ශනපති හා විද්‍යාපති උපාධි ශිෂ්‍යන්ගේ පර්යේෂණ නිබන්ධන හා නිපුණත ව්‍යාපෘති අධීක්ෂණයෙහිද ද අධ්‍යයන කාර්ය මණ්ඩලය නියුක්තව සිටිති.

පශ්චාත් උපාධි ඩිප්ලෝම හා සහතික පත්‍ර වැඩසටහන්වලට සම්බන්ධිත කටයුතුවල සාර්ථකත්වය හඳුනා ගන්නා ලද්දේ ,තත්ත්ව ප්‍රමිති,අදාළත්වය ,සාර්ථක පාඨමාල අවසන් කරන ශිෂ්‍යන්ගේ සංඛ්‍යාව පදනම් කරගෙනයි.

අධ්‍යයන වැඩසටහන්වල ගුණාත්මකභාවය නිරීක්ෂණය කරන ලද්දේ ක්‍රම කිහිපයක් මගිනි.පළමුව, එක් එක් අධ්‍යයන වැඩසටහනෙහි හිමි වන කුසලතා සම්මාන , අධ්‍යාපනයේ ප්‍රගතිය දක්වනු ලබන බවට අපේක්ෂා කෙරේ.2009 වසරේදී ලද 10% කුසලතා සම්මාන ප්‍රමාණය 2010 වසරේදී 12 % දක්වා වැඩි කිරීමට අධ්‍යයන කාර්ය මණ්ඩලය විශේෂ ප්‍රයත්නයෙක යෙදුණහ .

මෙම ඉලක්ක ,වෙසෙසින්ම ඇති කරගන්න ලද්දේ ,පසුව පත් කරන ලද ශිෂ්‍ය පර්යේෂණ හා ව්‍යාපෘති - ක්‍රියාකාරකම් ඔස්සේ ය.මෙය, ගුණාත්මක බව නිරීක්ෂණය කිරීමේ තවත් එක් මිනුමක් විය.

අධ්‍යයන වැඩ සටහන් කාලීනව සමාලෝචනය කිරීමට අමතරව,ආයතනය වර්තමානයෙහි අනුගමනය කරන ක්‍රියාකාරකම්වල හා PIM ආයතනයෙහි සෑම කාර්යයෙකම ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමට ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව ,විවෘතව සාකච්ඡා කිරීමට ආචාර්ය මණ්ඩලයේ වාර්ෂික වැඩ කඳවුරු පැවැත්වේ.අභ්‍යන්තර ක්‍රම පද්ධති හා ,වෙසෙසින් MBA හා සමාන්තර වැඩ සටහන් හා සම්බන්ධ ක්‍රියාකාරකම් වැඩි දියුණු තත්ත්වයට පත් කිරීමට මෙම ආචාර්ය මණ්ඩල වැඩ කඳවුරු මහෝපකාරී වන බව හෙළි වී ඇත.

<u>අනධ්‍යයන කාර්ය මණ්ඩලය</u>

මෙම වර්ෂය තුළදී,ආයතනය පූර්ණ කාලීන කාර්ය මණ්ඩලය 21 දෙනකුගෙන් සමන්විත විය.සනීපාරක්ෂක කටුයතු හා පිරිසුදු කිරීමේ ද ආරක්ෂක කටුයතු ද ආපන ශාලා පහසුකම් සැපයීම ද බාහිර ආයතන ඔස්සේ ලබා ගන්න ලදි.

කොට්ඨාශය /ශාඛාව	වඩා ජ්‍යෙෂ්ට කාර්ය මණ්ඩලය	ජ්‍යෙෂ්ට කාර්ය මණ්ඩලය	කනිෂ්ට කාර්ය මණ්ඩලය	සුළු සේවක කාර්ය මණ්ඩලය
පරිපාලන හා අධ්‍යයන කටයුතු	01	02	04	03
පරිගනක මධ්‍යස්ථානය	01	02	-	-
පුස්තකාලය	01	03	-	-
අධ්‍යක්ෂක කාර්යාලයය	01	-	-	-
මූල්‍ය	01	-	02	-
එකතුව	21			

පර්යේෂණ , නව්‍යකරණය හා ප්‍රකාශන

විෂය	ප්‍රකාශිත	වානිජ්‍යකරණයට	ඉදිරිපත්කරනලද
අ .MBA ශිෂ්‍යයන්ගේ පර්යේෂණ	-	-	200
ආ.සංග්‍රහ සංඛ්‍යාව	04	04	04
ඇ. ග්‍රන්ථ සංඛ්‍යාව	05	05	05
ඈ. පුවත්පත්හී පලකරන ලිපි	20	දිනපතා පුවත්පත් වල පළවුණු	15
එකතුව	29	09	224

ශ්‍රී ලංකාවෙහි කළමනාකරණ විෂයයෙහි පර්යේෂණ දැනට පවතිනුයේ මූලික අවධියකය.මෙම විෂයය පිළිබඳව , පර්යේෂණ සම්ප්‍රදායක් අප කෙරෙන් මේ දක්වාම වර්ධනය වී නොමැත. මෙහිලා පවතින සැබෑ අභියෝගය නම්, අපගේ ප්‍රධාන පර්යේෂණ ප්‍රයන්ත සංවිධානය කොට, වර්ධනය කිරීමට අවශ්‍ය වන දර්ශන පදනමක් සොයා ගැනීමයි. පර්යේෂණයේ (හා සොයා ගැනීම් ප්‍රකාශනයෙහි) ප්‍රධාන අරමුණ නම්, විද්‍යාවක් මෙන්ම වෘත්තියක් වශයෙන් , කළමනාකරණ විෂයය පෝෂණය කිරීමට අවශ්‍ය වන දේශීය කළමනාකරණ අන්තර්ගතය සොයා ගැනීමයි. ගෞරවනීය මට්ටම් වෙත පර්යේෂණවල තත්ත්වයන් ඔසවාලීම සඳහා, ක්‍රම හා ප්‍රවේශ නගා සිටුවීමට අපි සුදුසු මාර්ග සොයමු. ශ්‍රී ලාංකික සන්දර්භයක් දැනුම හසුරුවාලීමත්අතර පවත්නා මහත් හිඩැස් වෙත PIM ආයතනයේ පර්යේෂණ අරමුණු යොමු වී පවතී.

ප්‍රකාශනායත් සංවාදයත් සඳහා දිගින් දිගටම පදනමක් සැපැයීමට 1996 දී අරඹන ලද ආයතනයේ තෛයිමාසික ප්‍රකාශනය වන ශ්‍රී ලන්කන් ජර්නල් ඔෆ් මැනේජ්මන්ට් විශාල වශයෙන් අවකාශ ලබා දෙයි. මෙම ප්‍රකාශනයෙහි මූලික අරමුණ නම්, කළමනාකරණය හා සම්බන්ධිත ගැටළු, ප්‍රායෝගික විධි, හා වර්ධනයන් පිළිබඳව ප්‍රකාශන මාධ්‍යක් ලෙස ක්‍රියා කරමින් උක්ත ක්ෂේත්‍රවල පර්යේෂණ හා අධ්‍යයනවල ප්‍රතිඵල ව්‍යාප්ත කිරීමයි.කළමනාකරණ ක්ෂේත්‍රයට සම්බන්ධිත කෘති විද්‍යාර්ථීන් හා වෘත්තිකයන් විසින් පළ කරවීමට මෙම සංග්‍රහය විවෘත පවතී.

වර්තමාන කළමනාකරුවන්ගේ නැඟී එන අවශ්‍යතා සපුරාලීමට, මෙම ප්‍රකාශන සංග්‍රහයට අමතරව අර්ධ වාර්ෂික "වෘත්තිය කළමණාකරු " සඟරාව ද මෙම වසරේදී ප්‍රකාශයට පත් කරන ලදි .වෙළෙඳ පොළට මෙම සඟරාව හඳුන්වා දීමේ පරමාර්ථය වූයේ කියවා තේරුම් ගැනීමට පහසු ශෛලියකින් වැදගත් කළමනාකරණ දැනුම ව්‍යාප්ත කරවීමයි.යම් විශේෂිත විෂය නැඹුරුවක් මෙහි නොමැති වන අතර සංකීර්ණ හා කැළඹුණු පරිසරයක සිය කටයුතු මෙහෙයවන වත්මන් කළමනාකරුවන් හට වැදගත් වන එමෙන්ම කාලෝචිත ගැටළු මෙම සඟරාවෙන් ආමන්ත්‍රණය කෙරේ.

වැඩසටහන් සම්මන්ත්‍රණ හා වැඩමුළු

විෂයය	සහභාගි වුණු	සම්පූර්ණ කළ	ගණන
අ). සමාගම් සඳහා කළමනාකරණ සංවර්ධන හා පුහුණු වැඩ සටහන්	සියලු දෙනා ම	සම්පූර්ණ කළා	06
ආ). MBA ශිෂ්‍යයනට වැඩ මුළු	සියලු දෙනා ම	සම්පූර්ණ කළා	05
ඇ). ආචාර්ය මණ්ඩලය සඳහා වැඩ මුළුව	ආචාර්ය මණ්ඩලයේ සියලු දෙනා ම	සම්පූර්ණ කළා	01

ආරම්භ කරන ලද නව පාඨමාලා

PIM ආයතනයත් ඔස්ට්‍රේලියාවේ කැන්බෙරා විශ්වවිද්‍යාලයයෙහි රේගු හා සුරාබදු අධ්‍යයනය පිළිබඳ කේන්ද්‍රයත් (CCES) ඒකාබද්ධ ව ජාත්‍යන්තර වෙළෙඳාම හා ඒකාබද්ධ කාර්ය සංවිධානය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණය හා සම්බන්ධිත විද්‍යාපති පාඨමාලාව සැලසුම් කරන ලදී. සමාගම් හා පෞද්ගලික ආයතනවල නිපුණතා මට්ටම් වැඩි දියුණු කිරීමට අවශ්‍ය වන නූතන ආර්ථිකයෙහි ජාත්‍යන්තර වෙළෙඳාම මුඛ්‍ය ක්ෂේත්‍රයෙකි.

උක්ත ක්ෂේත්‍රයෙහි පුළුල් අවශ්‍යතා කෙරෙහි අවධානය රඳවමින් අවශ්‍ය දැනුම හා කුසලතා ලබා දීමේ අරමුණ පෙරදැරි ව ජාත්‍යන්තර වෙළෙඳාමේ හා ඒකාබද්ධ කාර්ය සංවිධානයට අදාළ මූලික කරුණු පාඨමාලාවේ වැඩසටහනට ඇතුළත් වී ඇත.

මීට අමතර ව මෙ ම පාඨමාලාව සැලසුම් කොට ඇත්තේ ශිෂ්‍යයනට ක්‍රමානුකූලව ජාත්‍යන්තර වෙළෙඳාම හා ව්‍යාපාර ඇගැයීමේ සිට කාර්ය සාධන මෙහෙයැවීම් හා සම්පාදන ජාලයට අයත් කටයුතු පිළිබඳ ව ගැඹුරු අවබෝධයක් ලබා දෙනු සඳහා ය. මෙ වැනි මෙහෙයුම් හා ක්‍රියාකාරකම් ඉටු කළ යුතු නෛතික රාමුව ද මින් හෙළිදරව් කෙරෙන අතර, එ ම වැඩ කටයුතු මෙම වැඩසටහනෙහි පුළුල් ව විස්තර කෙරේ.

පුණරාවර්තන වියදම්

	2009 (රු.)	2010 (රු.)
අ. පුද්ගල වැටුපු හා දීමනා	18,647,494	19,243,443
ආ. ගමන් වියදම්	1,099,928	1,681,218
ඇ. සම්පාදන	4,529,871	6,028,785
ඈ. නඩත්තුව	1,096,764	3,150,345
ඉ. කොන්ත්‍රාත්තුගත සේවා	12,066,360	13,625,720
ඊ. සෙසු	21,501,812	24,304,280
උ. ව්‍යාපෘති වලට අදාල වියදම්	6,042,526	15,224,206
එකතුව	**64,984,755**	**83,257,997**

ප්‍රාග්ධන වියදම්

විෂය විස්තර	2009 (රු.)	2010 (රු.)
අ. දැව භාණ්ඩ හා කාර්යාලයීය උපකරණ මිල දී ගැනීම්	1,778,108	4,785,565
ආ. යන්ත්‍රෝපකරණ මිල දී ගැනීම්	-	38,915
ඇ. ගොඩනැගිලි හා ඉදිකිරීම් අත්පත්කර ගැනීම්	-	-
ඈ. සෙසු	385,397	1,474,784
ඉ. ඉඩම් හා ගොඩනැගිලි පුණුරුත්ථාපන හා නවීකරණය	2,851,066	7,845,552
එකතුව	**5,014,571**	**14,144,816**

ව්‍යාපෘති (බාහිර / අභ්‍යන්තර ප්‍රතිපාදන මගින්)

වැය හා විස්තර	ණය / ප්‍රධානය	ප්‍රතිපාදන සැපයීම	
ප්‍රධාන රාජ්‍ය නව්‍යකරණ නිලධරයන් වෙනුවෙන් e- රාජ්‍ය වර්ධනය, පුහුණුව හා නිකුතුව සඳහා උපදේශන සේවා	ලෝක බැංකුව	ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ නියෝජිතායතනය (TCE)	21,190,000
එකතුව			**21,190,000**

ව්‍යාපෘති වියදම් (බාහිර / අභ්‍යන්තර ප්‍රතිපාදන මගින්)

වැය	TCE (රු.)	2009 හි වියදම් (රු.)	2010 හි වියදම් (රු.)	2010.12.31 ට සමුච්චිත වියදම්	භෞතික ප්‍රගතිය - %
ප්‍රාග්ධන නවීකරණ නිලධරයන් පුහුණු කිරීමේ වැඩ සටහන	21,190,000	-	5,257,655	5,257,655	35% (දළ වශයෙන්)
එකතුව					

මූල්‍ය ප්‍රගතිය (වියදම්)

විෂයය	2010 හි ප්‍රතිපාදන (රු.)	2010 වියදම් (රු.)	ඉතිරිය/ඉක්මවීම (රු.)
අ. පුනරාවර්තන - ව්‍යාපෘති හැර	77,522,000	83,257,997	(5,735,997)
ආ. ප්‍රාග්ධන - ව්‍යාපෘති හැර	11,800,000	14,144,816	(2,344,816)
ඇ. ව්‍යාපෘති දේශීය අරමුදලින්	-	-	-
ඈ. ව්‍යාපෘති විදේශ අරමුදලින්	5,257,655	5,257,655	-
එකතුව	**94,579,655**	**102,660,468**	**(8,080,813)**

මූල්‍ය ප්‍රගතිය (උත්පාදිත ආදායම)

මූල්‍ය උත්පාදනය	2010 හි සැපයුම (රු.)	2010 එකතුව (රු.)	හර / බැර (රු.)
අ. උපාධි අපේක්ෂක අධ්‍යයන	-	-	-
ආ. පශ්චාත් උපාධි අධ්‍යයන	82,800,000	109,843,546	27,043,546
ඇ. උපදේශන සේවා	3,600,000	4,937,100	1,337,100
ඈ. සෙසු	18,650,000	28,652,675	10,042,675
එකතුව	**105,050,000**	**143,433,321**	**38,423,321**

2010 මූල්‍ය ක්‍රියාකාරිත්වය පිළිබඳ විග්‍රහය

1997 වසරෙහි දී අරඹන ලද ස්ව-මූල්‍ය සම්පාදන ප්‍රතිපත්තිය අනුව මෙ ම වසර තුළ දී PIM ආයතනයට කිසිදු (පුනරාවර්තන හා ප්‍රාග්ධන) ප්‍රතිපාදනයක් රාජ්‍ය මූල්‍ය සම්පත්වලින් නොලැබිණි. තව ද එම වසරේ සිට ම පුනරාවර්තන වියදම් සඳහා විශ්ව විද්‍යාලයීය ප්‍රතිපාදන කොමිසමෙන් හෝ භාණ්ඩාගාරයෙන් PIM හෝ ආයතනය කිසිදු ප්‍රතිපාදනයක් ලබා නොගන්නා ලද මෙම වසරෙහි දී රුපි. 38,100,693/= ක මූල්‍ය අතිරික්තයක් වාර්තා විය. විශ්වවිද්‍යාල පද්ධතිය තුළ කළමණාකරණ අධ්‍යාපනය තරගකාරී ව වර්ධනය කළ හැකි බව මින් පෙන්නුම් කරයි.

විෂයය	නිර්ණායකය	එක් ශිෂ්‍යයකු සඳහා වියදම
අ. එක් ශිෂ්‍යයකු සඳහා පුනරාවර්තන වියදම	පුවි./ මුළු ශිෂ්‍යයන් සංඛ්‍යාව	175,280
ආ. එක් ශිෂ්‍යයකු සඳහා ප්‍රාග්ධන වියදම	ප්‍රාවි./ මුළු ශිෂ්‍යයන් සංඛ්‍යාව	29,779
එකතුව		

2010 දී ලද යටිතල පහසුකම්

ශාරීරික යෝග්‍යතා පුහුණු මධ්‍යස්ථානය :-

ඉතා වැදගත් වන කාර්ය ජීවිතය හා ඉගෙනීම අතර තිබිය යුතු සමතුලිතතාව ඇති කර ගැනීමට PIM ආයතනයෙහි වැඩ සටහන් හදාරණ සැලකිය යුතු ශිෂ්‍යයන් සංඛ්‍යාවකට හැකියාවක් නොපවතී. බෙහෙවින් ම මානසික ආතතියත් රෝගී බවත් ශාරීරික යෝග්‍යතාව කෙරෙහි සැලකිලිමත් නොවීමේ ප්‍රතිඵල වේ. මෙ ම අපේක්ෂාව සපුරාලීමට උක්ත මධ්‍යස්ථානය සහාය වේ. තව තවත් පහසුකම් හා උපකරණ සහිත ව මෙ ම මධ්‍යස්ථානය තව දුරටත් වර්ධනය කෙරේ.

විස්තර	වියදම (රු.)	භෞතික ප්‍රගතිය
ශාරීරික යෝග්‍යතා පුහුණු මධ්‍යස්ථානය	1,000,000/=	100%

සම්පිණ්ඩනය

වර්ධනය වන තරගකාරීත්වය මධ්‍යයේ PIM ආයතනය එහි ප්‍රධාන වැඩ සටහන වන MBA පාඨමාලාවත් පසුගිය වසර ගණනක් ඔස්සේ තරගකාරී ව රැඳී පැවැතිණි. අදාළත්වයටත් ගුණාත්මක භාවයටත් සාර්ථකව බලපාන කරුණු දෙකක් වෙයි. ඒ නම් තෝරා ගන්නා ලද ප්‍රධාන වැඩ සටහන් වන MBA / MPA පාඨමාලා දිගින් දිගටම විශිෂ්ටව සපුරාලමින්, වෙසෙසින් ම පෞද්ගලික අංශයෙහි විශේෂිත පුහුණු හා ප්‍රවර්ධන අවශ්‍යතාවලට ගැලපෙන අයුරින්ම සපුරාලන විවිධ විධායක ප්‍රවර්ධන වැඩසටහන් (EDP) කෙරෙහි ඉමහත් අවධානය යොමු කිරීමයි.
යටිතල පහසුකම් වර්ධනය කරමින් ආචාර්ය මණ්ඩල සම්පත්වල ගුණාත්මක හා සාංඛ්‍යාත්මක වැඩි දියුණු වීම් ඉහතින් සඳහන් ලද අධ්‍යයන වැඩ සටහන් හා පුහුණු කටයුතු සැලැසුම් කරන ලද ලෙසින් ම ලබා දීමට උපකාරී වනු ඇත.

මහාචාර්ය උදිත ලියනගේ
අධ්‍යක්ෂ
කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය

2011 නොවැම්බර් 17 දින

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයය

2010 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය

විස්තරය	2009		සටහන්	2010	
	රු.		අංකය	රු.	
වත්කම්					
ජංගම නොවන වත්කම්					
අ. ඉඩම් හා ගොඩනැගිලි	38,451,186.00			42,560,924.62	
ආ. විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ	8,804,041.00			8,856,796.64	
ඇ.පුස්තකාල පොත් හා වාර ප්‍රකාශන	1,358,392.00			2,684,631.88	
ඈ. මෝටර් වාහන	4,775,260.00			2,545,052.93	
ඉ. උපාධි ලෝගු	5,732.00			320,543.00	
ඊ. කාර්යාලීය ලී බඩු හා සවිකිරීම්	898,532.00			611,294.34	
උ. කාර්යාලීය උපකරණ	4,945,253.00			9,437,534.92	
ඌ. යන්ත්‍ර සූත්‍ර	31,400.00	59,269,796	1	54,615.00	
					66,430,307.33
ආයෝජන		36,165,000	2		90,448,690.00
		95,434,796			156,878,997.33
ජංගම වත්කම්					
අ. තොග		349,612	3		825,418.80
ආ. ජාත්‍යන්තර වැඩසටහන - ප්‍රකාශන තොග		-			832,912.00
ඇ. විවිධ ණයගැතියෝ		161,338	4		1,802,337.79
ඈ. කාර්ය මණ්ඩල ණය සහ අත්තිකාරම්		3,102,496	5		2,482,566.00
ඉ. විවිධ අත්තිකාරම්		552,351	6		42,688.50
ඊ. වෙනත් විශ්වවිද්‍යාල හා ආයතනවලින් ලැබිය යුතු මුදල		7,518,159			-
[illegible]ාලින් ගෙවීම්		81,492			20,516.75
ඌ. වෙනත්		511,663	7		2,805,760.66
එ. අතැති මුදල්		11,828,962	8		14,706,254.25
		-			349.00
මුළු වත්කම්		**119,540,869**			**180,397,801.08**

මහාචාර්ය උදිත ලියනගේ
අධ්‍යක්ෂ

ජේ. කේ. එස්. රණපුර
සහකාර ලේකාධිකාරී

පී. පී. මෛත්‍රීරත්න
නියෝජ්‍ය මූල්‍යාධිකාරී

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

2010 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය

විස්තරය	2009	සටහන්	2010
	රු.	අංකය	රු.
හිමිකම් හා වගකීම්			
ප්‍රාග්ධනය			
a.වැය වූ මූලධන ආධාර	143,742,531		166,986,089.57
සංචිත			
a.පොදු සංචිත	(43,977,932)		(18,935,807.23)
b.පරිත්‍යාග සංචිතය	1,593,842		2,036,493.97
සීමාකාරී අරමුදල්			
a. අනුස්මරණ ශිෂ්‍යත්ව අරමුදල	273,853	9	306,603.74
ජංගම නොවන වගකීම්			
පාරිතෝෂිත සඳහා වෙන්කිරීම්	7,289,682	10	7,564,523.00
ජංගම වගකීම්			
a. විවිධ ණයහිමියෝ	3,751,825	11	10,538,133.62
b. තැන්පතු	2,911,829	12	4,085,684.44
c. උපචිත වියදම්	2,641,098	13	5,360,655.88
d. වෙනත්	1,314,141	14	2,455,424.09
මුළු වගකීම්	**119,540,869**		**180,397,801.08**

මහාචාර්ය උදිත ලියනගේ
අධ්‍යක්ෂ

ජේ. කේ. එස්. රණපුර
සහකාර ලේකාධිකාරී

පී. පී. මෛත්‍රීරත්න
නියෝජ්‍ය මූල්‍යාධිකාරී

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයය

2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

ආදායම් හා වියදම් ගිණුම

විස්තරය	2009 රු.		2010 රු.	
ආදායම්				
1. ආයෝජන පොලී	1,025,418		5,494,782.42	
2. ණය හා අත්තිකාරම් පොලී	135,148		127,747.58	
3. දේපල වලින් ලැබුණු කුලී	3,526,400		3,359,717.00	
4. පැරණි ගබඩා ද්‍රව්‍ය විකිණීම	1,000		31,150.00	
5. විවිධ ලැබීම්	3,382,481		5,571,143.79	
6. ලියාපදිංචි ගාස්තු (පශ්චාත් උපාධි)	157,100		136,500.00	
7. ඉගැන්වීම් ගාස්තු (පශ්චාත් උපාධි)	75,946,791		109,843,545.69	
8. විභාග ගාස්තු (පශ්චාත් උපාධි)	351,000		300,000.00	
9. වෘත්තීය කළමනාකරු සඟරාව	46,950		19,350.00	
10. අධ්‍යයන හා වෘත්තීය ලිවීමේ ග්‍රන්ථය	884,820		268,878.00	
11. අමතර පොත් විකිණීම	-		147,400.00	
12. ශ්‍රී ලාංකීය පාරිභෝගික පැතිකඩ සඟරාව	118,870		35,700.00	
13. U.N.D.P ව්‍යාපෘතිය	345,000		-	
14. ප්‍රකාශන විකිණීම	83,435		1,130,195.00	
15. පුස්තකාල දඩ හා ගාස්තු	56,335		83,110.00	
16. බාහිර පාර්ශවයන්ට සපයන ලද සේවා	5,178,123		4,937,100.00	
17. MPA වැඩසටහන් ගාස්තුව	-		8,327,000.00	
18. ජාත්‍යන්තර වැඩසටහන			3,647,501.72	*
19. උපාධි ප්‍රදානෝත්සව ලැබීම්	2,677,377		12,500.00	
මුළු ආදායම		**93,916,248**		**143,473,321.20**
වියදම්				
a. සාමාන්‍ය පාලන සහ කාර්ය මණ්ඩල සේවා	27,737,425		33,697,483.39	
b. අධ්‍යයන සේවා	19,511,927		19,103,846.11	
c. ඉගැන්වීමේ සම්පත්	1,533,792		1,556,976.02	
d. උපකාරක ක්‍රියාකාරකම්	1,761,273		1,585,748.25	
e. බාහිර පාර්ශවයට සලසන සේවා	3,130,483		4,585,340.50	
f. MPA වැඩසටහන	-		4,149,959.20	
i. ජාත්‍යන්තර වැඩසටහන			5,505,030.72	
h. ප්‍රකාශන වියදම්	2,912,042		2,120,622.10	
මුළු වියදම්	56,586,942	**(56,586,942)**		**(72,305,006.29)**
ක්ෂය ගැලපීමට පෙර වියදමට වැඩි ආදායම		**37,329,306**		**71,168,314.91**
ක්ෂය වීම්		(8,397,813)		(12,089,683.81)
		28,931,493		**59,078,631.10**
වියදමට වැඩි ආදායම		28,931,493		59,078,631.10

* සටහන් අංක 15 බලන්න

මහාචාර්ය උදිත ලියනගේ	ජේ. කේ. එස්. රණපුර	පී. පී. මෛත්‍රීරත්න
අධ්‍යක්ෂ	**සහකාර ලේඛාධිකාරී**	**නියෝජ්‍ය මුල්‍යාධිකාරී**

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයය
2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
ආදායම් හා වියදම් විසර්ජන ගිණුම

ආදායමට වැඩි වියදම		28,931,493.00		59,078,631.10
පෙර වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ ශේෂය	(78,099,229.00)		(44,904,308.35)	
පොදු සංචිතයෙන් මුලධන සඳහා වෙන්කරන මුදල	5,939,442.00	(72,159,787.00)	(32,968,460.98)	(77,872,769.33)
පොදු සංචිත		(43,228,294.00)		
එකතුකලා. පෙර වර්ෂයේ ආදායමට සිදුකළ ගැලපුම්		1,795,618.87		50,000.00
අඩුකලා. පෙර වර්ෂයේ වියදමට සිදුකළ ගැලපීම්		(3,471,633.22)		(191,669.00)
ශේෂ පත්‍රයට ගෙන ගියා		**(44,904,308.35)**		**(18,935,807.23)**

මහාචාර්ය උදිත ලියනගේ
අධ්‍යක්ෂ

ජේ. කේ. එස්. රණපුර
සහකාර ලේකාධිකාරී

පී. පී. මෛත්‍රීරත්න
නියෝජ්‍ය මුල්‍යාධිකාරී

කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයය
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය – 2010

	රු .
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයන්	
අතිරික්තය	59,078,631.10
මුදල් ප්‍රවාහයක් ජනිත නොවූ අයිතමයන් හා ගැලපුම්	
ක්ෂය වීම්	12,089,683.81
පාරිතෝෂික සඳහා වෙන් කිරීම්	521,380.00
ආයෝජන සඳහා පොලී	(5,494,782.42)
පූර්ව වර්ෂ ගැලපීම්	83,760.17
කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය	**66,278,672.66**
තොගයේ වැඩි වීම	(475,806.80)
ලැබිය යුතු වටිනාකම් හි අඩු වීම	619,930.00
විවිධ අත්තිකාරම් අඩු වීම	509,662.50
කලින් ගෙවීම් අඩු වීම	60,975.25
තැම්පතු අඩු වීම	446,119.00
උපචිත වියදම් වැඩි වීම	(1,023,659.12)
වෙනත් වත්කම් වැඩි වීම	1,141,283.45
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**1,278,504.28**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය	
ඉඩම් හා ගොඩනැගිලි මිලට ගැනීම	(7,555,815.59)
විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ මිලට ගැනීම	(1,546,940.00)
පුස්තකාල පොත් හා වාර ප්‍රකාශන මිලට ගැනීම	(1,474,784.00)
කාර්යාල උපකරණ මිලට ගැනීම	(2,788,577.68)
යන්ත්‍ර උපකරණ මිලට ගැනීම	(38,915.00)
ලී බඩු හා උපකරණ මිලට ගැනීම	(450,047.26)
ආයෝජන	(54,000,000.00)
ආයෝජන වලින් ලැබුණ පොලී	3,365,451.48
ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**(64,489,628.05)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය	
අනුස්මරණ ශිෂ්‍යත්ව අරමුදල	32,750.74
වාහන කල්බදු	(1,073,691.38)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**(1,040,940.64)**
මුදල් හා මුදල් වලට සමාන අයිතමයන් හි වැඩි වීම	2,026,608.25
වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් නොවන අයිතමයන්	12,679,995.00
වර්ෂය අවසානයේ මුදල් හා මුදල් නොවන අයිතමයන්	**14,706,603.25**

මහාචාර්ය උදිත ලියනගේ	ජේ. කේ. එස්. රණපුර	පී. පී. මෛත්‍රීරත්න
අධ්‍යක්ෂ	**සහකාර ලේඛාධිකාරී**	**නියෝජ්‍ය මූල්‍යාධිකාරී**

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல / My No. } පීඒ/ඒ/පීඅයිඑම්/එෆ්ඒ/2010 ඔබේ අංකය / உமது இல / Your No. } දිනය / திகதி / Date } 2011 ජුලි // දින

අධ්‍යක්ෂ,

කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය හා 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය ප්‍රකාර පනවා ඇති 1985 අංක 3 දරන කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 19 වගන්තිය, විශ්වවිද්‍යාල පනතේ 108(1) හා 111 වගන්ති හා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ(3),(4) සහ (7) උපවගන්ති සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය හා මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කෙරේ. මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

1.3 විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව
சுதந்திர சதுக்கம், கொழும்பு 07, இலங்கை
INDEPENDENCE SQUARE, COLOMBO 07, SRI LANKA

දුරකථනය / தொலைபேசி / Telephone. } 2691151
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. } 2697451
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ-மெயில் / E-mail. } oaggov@sltnet.lk

ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාර වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුලත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

සම්පූර්ණයෙන් ක්ෂය වූ නමුත් දැනට භාවිතයට ගනු ලබන පිරිවැය රු.40,285,117ක්වූ වත්කම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18ට අනුව ප්‍රත්‍යාගණනය කර ගිණුම් ගතකර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

මූල්‍ය ප්‍රකාශන පිළිබඳව වූ නියැදි පරීක්ෂණයේදී අනාවරණය වූ එකතුව රු.9,423,670ක් වූ ගිණුම්කරණ අඩුපාඩු කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂ වෙත 2011 මැයි 11 දිනැති කළමනාකරණ වාර්තාව මගින් යොමු කරන ලද අතර අඩුපාඩු නිවරදි කර සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2011 ජූනි 23 දින විගණනයට ඉදිරිපත් කෙරුණි. 2009 වර්ෂයේ ලාභාලාභ විසර්ජන ගිණුමේ අංක ගණිත දෝෂ සහ පිටපත් කිරීමේ දෝෂ අනාවරණය වූ අතර රු.62,686,900ක් ලෙස දක්වා තිබූ ලාභාලාභ විසර්ජන ගිණුමේ ඍණ ශේෂය රු.73,940,864ක් විය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී රු.44,904,308ක ඍණ ශේෂයක් ලෙස ඉදිරියට ගෙන විත් තිබුණි. එහෙත් ඊට හේතු ඉදිරිපත් කර නොතිබුණි.

2.2.3 හඳුනා නොගත් වියදම්

සමාලෝචිත වර්ෂයේ රු.5,360,656ක්වූ උපචිත වියදම් තුල 2006 වර්ෂයේ සිට ඉදිරියට එන හඳුනා නොගත් රු.690,668ක් වූ ශේෂයක් හා වර්ගීකරණය නොකළ විදේශීය ශාඛාවේ උපචිත වියදම් රු.3,743,217ක් ද ඇතුලත් විය.

2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

අ) කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ වර්ෂ 5කට වැඩි කාලයක සිට අය නොවී පවතින විවිධ ණය ගැතියන්ගේ ශේෂ වල එකතුව රු.161,338ක් විය.

ආ) 2006 වර්ෂයේ පුද්ගලික ආයතනයකට ලබාදුන් රු.40,000ක් වූ අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසාන වන තෙක් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ඇ) වර්ෂ 3කට වැඩි කාලයක සිට ආයතනය වෙත තැන්පත් කර ඇති පුස්තකාල තැන්පතු රු.1,782,088ක් අදාල පාර්ශවයන් වෙත ආපසු ගෙවීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.

ඈ) 2007 වර්ෂයේ සිට සේවයෙන් ඉවත් වී ගිය සේවකයන්ගේ රු.86,647ක් වූ ණය ඇපකරුවන්ගෙන් හෝ වෙනත් ආකාරයකින් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

අ) මූල්‍ය ප්‍රකාශන වල වටිනාකම රු.5,000,000ක් ලෙස දක්වා ඇති ආයතනයේ ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩමේ අයිතිය සනාථ කිරීම සඳහා හිමිකම් ඔප්පුව විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

ආ) ජාත්‍යන්තර ශාඛාවේ රු.2,911,912ක්වූ ලැබිය යුතු ගිණුම් හා රු.11,603,217ක්වූ ගෙවිය යුතු ගිණුම් සඳහා වයස් විශ්ලේෂණ සහිත උපලේඛන විගණනය සඳහා ඉදිරිපත් නොකළ අතර ශේෂ තහවුරු කිරීම් කැඳවා නොතිබුණි. මේ වන විට ජාත්‍යන්තර ශාඛාවේ කටයුතු පිළිබඳ විමර්ශණයක් සිදුවෙමින් පවතින බව අධ්‍යක්ෂ දැනුම් දී ඇත.

ඇ) ජාත්‍යන්තර ශාඛාව වසා දැමීමේදී මෙරටට ආපසු ගෙනඑන ලද වත්කම් පිළිබඳව 2010 මැයි 04 දින නියෝජ්‍ය මූල්‍යාධිකාරී විසින් කරන ලද වත්කම් භෞතික හඳුනාගැනීම හා 2009 දෙසැම්බර් 31 දිනට වූ වත්කම් වල ශේෂපත්‍ර වටිනාකම අතර වෙනස රු.15,207,356ක්වූ අතර ඊට හේතු ඉදිරිපත් නොකෙරුණි.

ඈ) දේශීයව ආරම්භ කරන ලද ජාත්‍යන්තර ශාඛා කාර්යාලයේ සේවයට විදේශීය ශාඛාවේ සේවය කළ සේවකයින් දෙදෙනෙකු කළමණාකරණ මණ්ඩල අනුමැතිය යටතේ පරිපාලන කළමණාකරු හා යන්ත්‍ර ක්‍රියාකරු ලෙස 2010 ජුනි 14 දින සිට අනුයුක්ත කර තිබුණි. ඔවුන් සඳහා 2010 නොවැම්බර් වන විට රු.924,700ක් වැටුප් ලෙස ගෙවා තිබුණි. ඔවුන්ගේ පත්වීම් ලිපි, රාජකාරි පැවරීමේ ලිපි හා ඔවුන් ඉටුකරන ලද රාජකාරි කටයුතු පිළිබඳ තොරතුරු කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

ඉ) ජාත්‍යන්තර ශාඛාවේ පැවැත් වූ පාඨමාලා සඳහා ලියාපදිංචි වූ ශිෂ්‍යයින්ගේ නාම ලේඛනයක් හෝ අයකළ පාඨමාලා ගාස්තු පිළිබඳ විස්තර අඩංගු ලේඛනයක් පවත්වා නොතිබුණු අතර ලියාපදිංචි වූ ශිෂ්‍යයන් සහ තව දුරටත් අය විය යුතු පාඨමාලා ගාස්තු පිළිබඳව විස්තර ආයතනය සතුව නොතිබුණි.

2.2.6 නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් නීති,රීති චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි වලට අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව	අනුකූල නොවීම
අ) 1983 අංක 12 දරන පරිතෝෂිත පනත 20 වගන්තිය	2010 වර්ෂය අවසානයේදී ආයතනයේ සේවයේ නියුතුව සිටි කාර්ය මණ්ඩලය වෙනුවෙන් පරිතෝෂිත දීමනා වෙන් කිරීම් රු.6,398,570ක් විය යුතු වුවත් ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන අනුව එහි ශේෂය රු.6,289,197ක් විය. රු.109,373ක් වූ ශේෂයන් අතර වෙනසට හේතු වූයේ පරිතෝෂිත ගණනය සඳහා සැලකිල්ලට නොගත යුතු අධ්‍යයන දීමනාව සැලකිල්ලට ගැනීම හේතුවෙනි.
ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 751	ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

ඇ) 1985 අංක 3 දරන කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ නියමාවලිය	2010 සැප්තැම්බර් සිට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සේවයට මුදාහල කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ සේවකයින් දෙදෙනකු සඳහා 2010 වර්ෂය අවසාන වනවිට රු.366,712ක් වැටුප් ලෙස ගෙවා තිබුණි.

3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

3.1. මූල්‍ය සමාලෝචනය

3.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුළ ආයතනයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.59,078,631ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.8,773,078ක් ලෙස දක්වා තිබුණද එය රු.8,928,069ක් විය යුතුව තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනය රු.50,150,562ක් විය. මෙම වර්ධනය සඳහා රු.3,687,520කින් ආයෝජන ආදායම, රු.1,046,760කින් ප්‍රකාශන අලෙවි ආදායම, රු.33,896,755කින් පාඨමාලා ගාස්තු ආදායම වැඩිවීම හා ජාත්‍යන්තර ශාඛාවේ වියදම රු.75,294,561කින් අඩුවීම ප්‍රධාන ලෙස බලපා තිබුණි.

3.2 මෙහෙයුම් සමාලෝචනය

3.2.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

අ) 2009 වර්ෂය දක්වා වෙනම ගිණුම් පිළියෙල කරන ලද ජාත්‍යන්තර ශාඛාව වසාදැමීමෙන් පසු එහි වූ වත්කම් හා වගකීම් නිසිලෙස හඳුනාගැනීමකින් හෝ සත්‍යාපනයක් මඟින් තහවුරු කර ගැනීමකින් තොරව ප්‍රධාන කාර්යාලයේ ලෙජර් ගිණුම් වලට ගෙන තිබුණි.

ආ) ආයතනයේ ස්ථාවර වත්කම් ලේඛනය, පවත්නා නීතිරීති රෙගුලාසි යටතේ සකස් කිරීමට, වත්කම් ලේඛන පැවැත්වීම, නිලධාරීන්ට පුහුණු කිරීම හා වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම යන කාර්යයන් සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොතේ 2.14.1 ඡේදයට පටහැනිව පුද්ගලයකු වෙත 2008 දෙසැම්බර් 20 දින රු.296,000කට පවරා දී තිබූ අතර අදාල ගෙවීම 2009 මාර්තු 30 දින සිදුකර තිබුණි. 2010 වර්ෂය සඳහාද ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීම හා භෞතික පරීක්ෂාව සඳහා රු.45,000ක මුදලක් 2011 අප්‍රේල් 05 දින අදාල පුද්ගලයා වෙත ගෙවා තිබුණි. මේ සඳහා දරන ලද වියදම පහත සඳහන් හේතූන් නිසා නිෂ්කාර්‍ය වියදමක් ලෙස නිරීක්ෂණය විය.

i. 2009 හා 2010 වර්ෂ වල අවසන් ගිණුම් වල සඳහන් වටිනාකම් අදාල ස්ථාවර වත්කම් ලේඛණයෙන් තහවුරු නොවීම.

ii. අදාල නිලධාරීන් පුහුණු නොකිරීම.

iii. ප්‍රත්‍යාගණන අගයන් ගිණුම් ගත නොකිරීම.

ඇ) වසා දැමුණු ජාත්‍යන්තර ශාඛාව වෙනුවෙන් ඩුබායිහි පවත්වාගෙන ගිය අංක 021-580683-001 දරන බැංකු ගිණුමේ, 2009 අගෝස්තු 31 දිනට වූ AED 3,000.31 ක්වූ ශේෂය සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් දේශීය බැංකු ගිණුමට මාරුකර ගැනීමට ආයතනය කටයුතු කර නොතිබුණි.

ඇ) ජාත්‍යන්තර ශාඛාවේ MBA 2007 සහ MBA 2008 යන පශ්චාත් උපාධි පාඨමාලා සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් සම්පූර්ණ කර නොතිබුණි.

3.2.2 අනාර්ථික ගණුදෙණු

ජාත්‍යන්තර ශාඛාවේ භාණ්ඩ මෙරටට ගෙන්වීමේදී එම භාණ්ඩ නිශ්කාෂනය කිරීමට ප්‍රමාද වීම හේතුවෙන් රු. 244,264ක ප්‍රමාද ගාස්තු ගෙවා තිබුණි.

3.2.3 නිසි අධිකාර බලයක් නොමැති ගණුදෙණු

අ) ජාත්‍යන්තර ශාඛාව මඟින් පවත්වනු ලැබූ සහතික පත්‍ර පාඨමාලා සඳහා කළමණාකාරණ මණ්ඩල අනුමැතියකින් තොරව ගාස්තු තීරණය කර අය කර තිබුණි.

ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන වලින් බැහැරව ඇස්තමේන්තුවක් පිළියෙල කිරීමෙන් තොරව වර්ග මීටර 900ක වාහන අංගණයක් ඉදිකිරීම සඳහා ආයතන 08කින් ලංසු කැඳවීම් කර අඩුම ලංසුකරු වෙත රු.1,339,600ක (වැට් රහිතව) මිලකට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. එම කොන්ත්‍රාත්තුව තවත් වර්ග මීටර 1000කින් වැඩි කර රු.2,881,400ක් (වැට් රහිතව) ගෙවා තිබුණි. මෙම වටිනාකම ආයතන ප්‍රසම්පාදන සීමාව ඉක්මවූවකි.

3.2.4 මතභේදයට තුඩුදෙන කරුණු

ජාත්‍යන්තර ශාඛා කාර්යාලය පවත්වාගෙන ගිය ගොඩනැගිල්ල හිමි ආයතනය විසින් 2010 ජනවාරි 07 දිනැති AED 56,750ක් වූ ආපසු එවූ චෙක්පත හා පරිශ්‍රයෙහි ඉතිරි කර පැමිණි AED 4,100 ක වටිනාකම ඇති වත්කම් පවරා ගැනීම සම්බන්ධයෙන් කුලී හිමියා විසින් එවන ලද 2009 අගෝස්තු 28 දිනැති ලිපිය හා එහි අන්තර්ගත කරුණු පහත සඳහන් හේතූන් නිසා ගැටළුකාරී විය.

අ) ලිපියේ දිනය 2009 අගෝස්තු 28 ලෙස සටහන් වුවද එම ලිපියේ 2010 ජනවාරි 07 දින ආපසු එවූ චෙක්පතක් පිළිබඳව සඳහන්ව තිබීම.

ii. AED 56,750ක්වූ ආපසු එවූ චෙක්පත සම්බන්ධ තොරතුරු බැංකු ප්‍රකාශය, චෙක්පත් දින දීර්ඝ කිරීමේ ලේඛනය මගින් තහවුරු නොවීම.

iii. කාර්යාල කුලී ගෙවීමේ නිවැරදිතාවය සහ ගෙවියයුතු කුලීය පිළිබඳ තහවුරු කරගතහැකි ලිපිගොනු හා ලේඛණ ආයතනය විසින් පවත්වා ගෙන ගොස් නොතිබීම.

4. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂකවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

අ) ගිණුම්කරණය

ආ) ස්ථාවර වත්කම්

ඇ) දේශන ශාලා කුළියට දීම

ඈ) ඉන්වෙන්ට්‍රි ලේඛන පවත්වාගෙන යාම

ඉ) භාණ්ඩ හා සේවා මිල දී ගැනීම

ඊ) පාඨමාලා අයදුම්පත් මුද්‍රණය සහ ආදායම් රැස් කිරීම

එච්.ඒ.එස්. සමරවීර

වැඩබලන විගණකාධිපති.

PIM

Vidya Uppatatam Setta

Postgraduate Institute of Management

2011 ජූනි 10

නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
කොළඹ 07

<u>ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයට අනුබද්ධිත කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විස්තරාත්මක කළමනාකරණ වාර්තාව</u>

2011 මැයි 11 දාතමින් යුත් යථෝක්ත වාර්තාව මගින් පෙන්වා දී ඇති කරුණු සම්බන්ධයෙන් අපගේ පැහැදිලි කිරීම් හා අප විසින් ගැනීමට අදහස් කරන පියවර මේ සමග ඉදිරිපත් කරන බව කාරුණිකව දන්වමි.

....
මහාචාර්ය උදිත ලියනගේ
අධ්‍යක්ෂ

1.4 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

(අ) ජාත්‍යන්තර ශාඛාවට අදල පෙර වර්ෂයේ ආදායම, වියදම, හා ක්ෂය, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් නොවීම නිසා වූ වරද නිවැරදි කරන ලදි. එමෙන්ම කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ පෙර වර්ෂයේ රු.9,324,191 ක් වූ ක්ෂය අගයන්ද සංසන්දනාත්මක මූල්‍ය ප්‍රකාශන වල නිවැරදිව ඇතුලත් කරන ලදි.

(ආ) සම්පූර්ණයෙන් ක්ෂය වූ නමුත් දැනට භාවිතයට ගනු ලබන වත්කම් ප්‍රත්‍යාගණනය කොට අදල ගැලපුම් ගිණුම් ගත කිරීමට ඉදිරියේදී පියවර ගනු ලැබේ.

(ඇ) කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය ප්‍රතිපත්තියක් ලෙස වත්කම් මිලදීගත් වර්ෂයේ ක්ෂය කරනු නොලැබේ. මිලදීගත් වර්ෂයේ ක්ෂය නොකිරීමේ ප්‍රතිපත්තිය මගින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 18 උල්ලංගනය නොවන බව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත භාවිත උපදෙස් අංක 04 මගින් ප්‍රකාශයට පත්කොට ඇත.

(ඈ) ජාත්‍යන්තර ශාඛාවේ විදේශ විනිමය ගනුදෙනු වලින් වූ රු.594.51 ක ලාභය ගිණුම්වල ගලපන ලදි.

2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.1 ගණකාධිකරණ අඩුපාඩු

2.1.1. අඩුවෙන් හා වැඩියෙන් දැක්වීම

(අ) රු. 771,387 ක් වූ ආයෝජන ආදායම් ගිණුම්ගත කිරීම ආශ්‍රිත දෝෂය 2009 වර්ෂයේ ගැලපීම් වලින් නිවැරදි කොට ඇත.

(ආ) සමාලෝචිත වර්ෂයේ විදේශීය ශාඛාවේ ආදායම් හා වියදම් රු. 2,620,000 කින් ද්විගණනය වීම නිසා සිදු වූ දෝෂය නිවැරදි කොට ගිණුම්වල ගලපන ලදි.

(ඇ) විදේශීය ශාඛාවේ රු. 438,000 ක් වූ ජංගම වත්කම් යටතට ගැනෙන තැන්පතු මුදල්, ප්‍රධාන කාර්යාලයේ ජංගම වගකීම් යටතට ගැනෙන තැන්පතු ගිණුමට ඇතුලත් වීම නිසා ශාඛාවේ ජංගම වත්කම් හා ප්‍රධාන කාර්යාලයේ ජංගම වගකීම් අඩුවෙන් නිරූපනය වී තිබුණි. මෙම වරද නිවැරදි කොට ඇත.

(ඈ) සමාලෝචිත වර්ෂයේ කාර්යාලීය උපකරණ ක්ෂය රු. 869,315 ක් වැඩිපුර ගණනය වීමෙන් වූ දෝෂය නිවැරදි කරන ලදි.

2.2 ස්ථාවර වත්කම් පරීක්ෂාව

(අ) විදේශීය ශාඛාවේ ස්ථාවර වත්කම් වැඩි දියුණු කිරීම් ලෙස දක්වා ඇත්තේ බද්දට ගනු ලැබූ ගොඩනැගිල්ලේ විදුලි රැහැන් ඇදීම, තාවකාලික කාමර වෙන්කිරීම (Partitioning) හා තීන්තගෑම (Painting) ආදිය සඳහා දරණ ලද පිරිවැයයි. මෙම අයිතමයන් හී පවරා ගැනීමේ වටිනාකමක් නොමැති බැවින්, විදේශීය ශාඛාවේ වත්කම් ප්‍රධාන කාර්යාලය සමග ඒකාබද්ධ කිරීමේදී, ගිණුම්ගතව පැවති පිරිවැය හා ක්ෂය ප්‍රතිපාදන පිලිවෙලින් විදේශීය ශාඛාවේ ප්‍රාග්ධනයෙන් හා පොදු සංචිතයෙන් ලියා හරින ලදි.

(ආ) ස්ථාවර වත්කම් අත්පත් කරගත් වර්ෂයේ ක්ෂය නොකිරීමේ ආයතනික ප්‍රතිපත්තිය අනුව UNDP ව්‍යාපෘතියෙන් පවරාගනු ලැබූ වත්කම් සමාලෝචිත වර්ෂය තුල ක්ෂය නොකල අතර ඒ සඳහා 2011 වර්ෂයේ සිට ක්ෂය කිරීමට පියවර ගනු ලැබේ.

2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) ජාත්‍යන්තර ශාඛා ශේෂ පත්‍රයේ 2009.02.31 දිනට පැවති ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂයන් පදනම් කොට සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලදි. මේ වන විට ජාත්‍යන්තර ශාඛාවේ කටයුතු පිළිබඳ විමර්ශනයක් සිදුවෙමින් පවතින අතර, එම විමර්ශන වාර්තාව ලැබුන විට අදාල ගිණුම් ශේෂයන් සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගනු ලැබේ.

(ආ) ඉඩමේ අයිතිය තහවුරු කෙරෙන හිමිකම් ඔප්පුවේ පිටපතක් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) විදේශීය ශාඛාවේ කටයුතු පිළිබඳ විමර්ශනයක් සිදුවන බැවින්, අදළ වාර්තාව ලැබුන පසු විදේශීය ශාඛාවේ වත්කම් වල ඌනතාවයක් පවතිනම් ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරනු ලැබේ.

(ඈ) ජාත්‍යන්තර ශාඛාවේ සේවය කළ මෙම සේවකයින් දෙදෙනාගේ පත්වීම් ලිපි, හා රාජකාරී ලැයිස්තු එම ශාඛාවේ කළමනාකරණ අධ්‍යක්ෂක විසින් ප්‍රධාන කාර්යාලයට ලබා දී නොමැත. විදේශීය ශාඛාවේ කටයුතු පිළිබඳව සිදුකෙරෙන විමර්ශනයේ වාර්තාව ලැබුන පසු අදළ විස්තර ලබාදීමට ක්‍රියාකරනු ලැබේ.

(ඉ) විදේශීය ශාඛාවේ පාඨමාලා සඳහා සහභාගී වූ ශිෂ්‍යයන් හා පාඨමාලා ගාස්තු පිළිබඳ තොරතුරු එම ශාඛාවේ කළමනාකරණ අධ්‍යක්ෂක විසින් සපයා නොමැත. ශාඛාවට අදළව සිදුකෙරෙන විමර්ශනයේ වාර්තාව ලැබුන පසු අදළ තොරතුරු ඉදිරිපත් කිරීමට පියවර ගනු ලැබේ.

2.4 පාරිතෝෂිත වෙන්කිරීම

(අ) I. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත්කරන ලද ආයතන චක්‍රලේඛ ලිපි අංක 08/1988 අනුව පාරිතෝෂිත දීමනා ගණනය කිරීමේදී අධ්‍යයන දීමනාව සැළකිල්ලට ගන්නා ලෙස උපදෙස් දී ඇති බැවින් ඒ අනුව ක්‍රියාකර ඇත.

II. 2007 වර්ෂයේ දී විශ්‍රාම ගිය මහාචාර්ය ඒ.ටී. ෆොන්සේකා මහතාගේ පාරිතෝෂිත දීමනා ශේෂය වූ 542,817 ක මුදල ගිණුම් වලින් අත්හැරීම නිසා වූ වරද නිවැරදි කර ඇත.

III. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛණ අංක 881 අනුව පාරිතෝෂිත ගෙවීම් ගණනය කිරීම සඳහා ජීවන වියදම් දීමනාව සැළකිල්ලට ගනු නොලැබේ. වැඩ බැලීම සඳහා වූ ගෙවීම් මාස හයක් හෝ ඊට අඩු කාලයකට සීමාවන බැවින් පාරිතෝෂිත ගණනය කිරීමේදී එය සැළකිල්ලට ගෙන නොමැත.

IV. සේවය හැරගොස් තිබූ සේවකයින් දෙදෙනෙකු වෙනුවෙන් පාරිතෝෂිත මුදල් ගිණුම්ගත කිරීම නිසා වූ වරද නිවැරදි කර ඇත.

2.5 නිරවුල් නොවූ ශේෂ

(අ) වර්ෂ 5කට වැඩි කාලයක සිට අය නොවී පවතින මෙම ණයගැති ශේෂ පිළිබඳ විස්තර අනාවරණය කරගැනීමට පරීක්‍ෂාවන් සිදුකෙරෙමින් පවතී.

(ආ) පොත්පත් මිලදීගැනීම සඳහා ගෙවා ඇති මෙම අත්තිකාරම් මුදල පියවීම පිළිබඳ තොරතුරු අනාවරණය කරගැනීමට පරීක්‍ෂාවන් සිදුකෙරෙමින් පවතී.

(ඇ) වර්ෂ 3කට අධික කාලසීමාවකට අදාළ මෙම තැන්පතු මුදල් ශිෂ්‍යයින් විසින් ඉල්ලුම්කොට නොමැති නිසා ආදායමට ගැනීමට කටයුතු කරනු ලැබේ.

(ඈ) රු.124,957 ක ණය මුදලින් රු.38,310 ක ප්‍රමාණය ප්‍රවර්තන සේවකයෙකුගෙන් අයවෙමින් පවතින මුදලින් ඉතිරි වී ඇති ශේෂය වේ. රු.86,647 ක් වූ ඉතිරි මුදල සේවය හැරගිය සේවකයින් දෙදෙනෙකුට අදාළ වන අතර එම සේවකයින්ගේ අර්ථසාධක අරමුදල් නිදහස් කරන විට ණය ශේෂය අයකර ගැනීමට පියවර ගනු ලැබේ.

2.6 හඳුනා නොගත් වියදම්

ප්‍රධාන කාර්යාලයේ හඳුනා නොගත් රු.690,668 ක් වූ උපචිත වියදම් පිළිබඳ විස්තර පරීක්ෂා කෙරෙමින් පවතින අතර විදේශිය ශාඛාවේ උපචිත වියදම් පිළිබඳ තොරතුරු ශාඛාවට අදාළව සිදුවෙමින් පවතින විමර්ශනයේ වාර්තාව මගින් ලබා ගැනීමට අපේක්‍ෂා කෙරේ.

3.2 මෙහෙයුම් සමාලෝචනය

3.2.1 කළමනාකරණ අකාර්යක්‍ෂමතා

(අ) විදේශිය ශාඛාවේ කටයුතු පිළිබඳව සිදුකෙරෙන විමර්ශන කටයුතු අවසන් වන තෙක් එහි වත්කම් හා වගකීම් පිළිබඳ නිසි හඳුනාගැනීමක් හෝ තහවුරු කර ගැනීමක් සිදුකල නොහැකි බැවින්, සමාලෝචිත වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී ඇතිවිය හැකි ප්‍රමාදය අවධානයට ලක්කොට 2009 වර්ෂයේ මූල්‍ය වාර්තාවල දැක්වෙන වත්කම් හා වගකීම් ප්‍රධාන කාර්යාලයේ ගිණුම් සමග ඒකාබද්ධ කරන ලදි. මෙම තීරණය 2011 අප්‍රේල් 8 දින පැවති කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කොට ඇත.

(ආ) විශ්ව විද්‍යාල කිහිපයකම ස්ථාවර වත්කම් ලේඛණ සකස් කිරීමේ නිරතව සිටි තැනැත්තෙකු වෙත අදාළ කාර්යය පවරන ලද්දේ ඒ පිළිබඳ පැවති නිපුණතාවය සැලකිල්ලට ගෙනයි. 2009 හා 2010 වර්ෂයන්හි අවසාන ගිණුම්වල සඳහන් වටිනාකම් ස්ථාවර වත්කම් ලේඛනය අතර පවතින නොගැලපීම් නිවැරදි කොට ස්ථාවර වත්කම් ලේඛනය නඩත්තු කිරීමට නිලධාරීන් පුහුණු කරන ලෙස මේ වන විටත් එම සේවා සැපයුම්කරු වෙත දක්වා ඇත. ප්‍රත්‍යාගණන අගයන් මත වත්කම් ගිණුම්ගත කිරීමට ඉදිරියේදී පියවර ගනු ලැබේ.

(ඇ) විදේශීය ශාඛාව වෙනුවෙන් ඩුබායි හි පවත්වාගෙන යන ලද ගිණුමේ 2009-08-31 දිනට පැවති AED 3000.31 ක් වූ ශේෂය දේශීය බැංකු ගිණුමට මාරු කරන ලෙස දැනුම් දී ඇත.

(ඈ) MBA 2007 පාඨමාලාව සාර්ථකව අවසන් කල සිසුන් 71 දෙනෙකු වෙත 2011 ජූලි 23 දින පැවැත්වෙන උපාධි ප්‍රධානෝත්සවයේදී MBA උපාධි පිරිනැමීමට විධිවිධාන යොදා ඇත. අනෙකුත් පාඨමාලා වල සිසුන්ගේ අධ්‍යයන කටයුතු වලින් 80% ක ප්‍රමාණයක් සාර්ථකව නිමකර ඇති අතර 2011 දෙසැම්බර් වන විට සියලු පාඨමාලා අවසන් කිරීමට සැළසුම් කොට ඇත.

3.2.2 අනාර්ථික ගනුදෙනු

විදේශීය ශාඛාවෙන් ගෙන්වන ලද භාණ්ඩ ආනයන තීරුබදු වලින් තොරව නිදහස් කර ගැනීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබාගන්නා තෙක් නිශ්කාශන කටයුතු ප්‍රමාද වූ බැවින් මෙම ප්‍රමාද ගාස්තුව ගෙවීමට සිදුවිය.

4. නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම හා නිසි අධිකාරී බලයක් නොමැති ගනුදෙනු

4.1 නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 අප්‍රේල් 8 දින පැවති කළමනාකරණ මණ්ඩල රැස්වීමේදී අනුමත විය.

(ආ) කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයට තාවකාලිකව අනුයුක්ත කරන ලද නිලධාරියෙකු වෙත ගෙවන ලද රු.221,220.50 ක වැටුප් හා ස්ථිරව මාරු කරන ලද සේවකයෙකු වෙත ගෙවන ලද රු.51,477.50 ක වැටුප් මුදල් වලින් රු.272,698 ක් වූ මෙම අගය සමන්විත වේ. තාවකාලිකව මාරු කරන ලද නිලධාරියා වෙනුවෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය විසින් අදාළ කාළසීමාව සඳහා කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය වෙත නිලධාරියෙකු අනුයුක්ත කරන ලද අතර එම නිලධාරියා වෙත වැටුප් ගෙවන ලද්දේ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය විසිනි. ස්ථිරව මාරුකරන ලද සේවකයා වෙනුවෙන් ගෙවන ලද වැටුප් මුදල ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ප්‍රතිපූරණය කරගැනීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ලේඛණයක් සකස්කිරීමට පියවර ගෙන ඇත.

(ඈ) ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව පිරිනමන අවස්ථාවේ අවධානයට ලක්නොවූ කාර්යයන් හේතුකොට ගෙන කොන්ත්‍රාත්තුවේ විෂය පථය පුළුල් කිරීමට සිදුවූ අතර ඒ සඳහා ප්‍රතිසම්පාදන කමිටු අනුමැතිය ලැබුණි. කෙසේ වුවද ප්‍රමාද දෝෂයක් නිසා එම අමතර වැඩ වල වටිනාකම සඳහා අමාත්‍යංශ අනුමැතිය ලබා නොතිබුණි. ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් ඇති නොවීමට පියවර ගනු ලැබේ.

4.2 <u>නිසි අධිකාරී බලයන් නොමැති ගනුදෙනු</u>

(අ) නව පාඨමාලාවන් සඳහා පාඨමාලා අධ්‍යයන සටහන් (Course Materials) සංවර්ධනය කිරීම සඳහා රු.20,000 ක උපරිමයකට යටත්ව ගෙවීම් සිදුකිරීමට කළමනාකරණ මණ්ඩලය විසින් ගන තිබූ 180:13 දරණ තීරණයට අනුකූලව AED 300ක් ද මුදල ද මාසික කාර්යය ප්‍රමාණය ඉක්මවා වැඩ කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීමට කළමනාකරණ මණ්ඩලය විසින් ගනුලැබූ 163:08 දරණ තීරණය අනුව AED 2800ක ගෙවීම ද අදාළ දේශකවරයා වෙත සිදුකරන ලදි.

(ආ) විදේශීය ශාඛාවේ MBA පාඨමාලා ශාස්තෘ කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කර ඇත. ඊට අමතරව පවත්වා ඇති පාඨමාලා සම්බන්ධයෙන් විදේශීය ශාඛාවේ කටයුතු වලට අදාළ විමර්ශන වාර්තාව ලැබුන පසු අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ.

5. <u>මතභේදයට තුඩුදෙන කරුණු</u>

විදේශීය ශාඛාවේ කටයුතු වලට අදාළව පැවැත්වෙන විමර්ශනයේ වාර්තාව ලැබුණු පසු මේ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ.